VII. තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

සටහන -

මෙම බඳවා ගැනීම හුදෙක් කාර්යාල සේවක සේවයේ රජකාරි ඉටු කිරීම සඳහා වන බැවින්, ඉහළ අධ්‍යාපන හෝ වෘත්තීය සුදුසුකම්

ලබා තිබීම මත, කාර්යාල සේවක සේවයේ සේවා ව්‍යවස්ථාවෙන් පරිබාහිරව විධිමත් පටිපාටියකින් තොරව වෙනත් වැටුපක් ලබා ගැනීමට හෝ එබඳු වැටුප් ව්‍යුහයක වන තනතුරකට පත් කිරීමට හිමිකමක් නොමැති බව සැලකිය යුතුය.

08. බඳවා ගැනීමේ ක්‍රමවේදය :

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පවත්වන ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයක දී අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙළ තරයේ ම අනුගමනය කරමින් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් කාර්යාල සේවක සේවයේ III ශ්‍රේණියේ කාර්යාල කම්කරු තනතුරට පත් කරනු ලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට අපේක්ෂිත භාෂා මාධ්‍යය පැහැදිලිව අයදුම්පතෙහි සඳහන් කළ යුතු අතර ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණය එම භාෂා මාධ්‍යයෙන් පැවැත්වේ.

I. ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙන පරිපාටිය පහත වගුවේ පරිදි වේ.

	නිර්ණායකය		*ලකුණු*
01	අධ්‍යාපන සුදුසුකම්	අ.පො.ස. (උ/පෙළ) සමත්ව තිබීම.	5
		අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ගණිතය, භාෂාව, දෙවැනි රාජ්‍ය භාෂාව, ඉංග්‍රීසි භාෂාව සහ වෙනත් භාෂා සඳහා සාමාර්ථයක් ලබා තිබීම (එක් භාෂාවක් සඳහා ලකුණු 2 බැගින් උපරිම විෂයයන් 5 ක් සළකා බලනු ලැබේ.)	10
02	ලබා ඇති වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද		10
03	බාහිර ක්‍රියාකාරකම් (ක්‍රීඩා/ සමාජසේවා ..... යනා දී)		10
04	පෞරුෂය හා සන්නිවේදනය		10
05	සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා		5
	මුළු ලකුණු		**50**

09. වැටුප :

I. වැටුප් කේතය - **PL-1-2025**

II. වැටුප් පරිමාණය, III, II හා I වන ශ්‍රේණිවලට අදාළ මාසික වැටුප් පරිමාණය - **රු. 40,000 - 10 X 450 – 10 X 490 – 10 X 540 – 12 X 590 - රු.61,880**/= කි.

(2027.01.01 දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව වැටුප් ගෙවනු ලැබේ. එතෙක් මෙම චක්‍රලේඛයෙහි උපලේඛන III අනුව නියමිත වැටුප ගණනය කරනු ලැබේ.)

10. අයදුම්පත් සමග ඉදිරිපත් කළ යුතු ලේඛන :

I. උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක්,
II. ජාතික හැඳුනුම්පත / වලංගු විදේශ ගමන් බලපත්‍රයේ සහතික කරන ලද පිටපතක්,
III. අධ්‍යාපන සහතිකවල සහතික කළ පිටපත්,
IV. ග්‍රාම නිලධාරී සහතිකය (DS 04 ආකෘතිය).

11. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයට කැඳවා, නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

13. සාවද්‍ය තොරතුරු සැපයීම :

(i.) අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම සම්මුඛ පරීක්ෂණයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවක දී වුව ද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

(ii.) අපේක්ෂකයකු විසින් සපයන ලද තොරතුරු පසු කලක දී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහුට/ඇයට තවදුරටත් පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බලනු නොලබන අතර මෙම සම්මුඛ පරීක්ෂණය හේතු කොට ගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුව ද යටත් වේ.

14. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

15. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ බඳවා ගැනීමේ ක්‍රියා මාර්ගය තුළ කිසියම් ගැටලුකාරී තත්ත්වයක් ඇති වුවහොත් හෝ ඒ පිළිබඳ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ නියෝගය පරිදි,

එස්. ජලදීපන්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 ඔක්තෝබර් මස 22 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
අංක 234/ඒ 3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

ඇමුණුම 01

කාර්යාල සේවක සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

අමාත්‍යාංශය	*දෙපාර්තමේන්තුව*	*ප්‍රාදේශීය කාර්යාලය*	*තනතුර*	*පුරප්පාඩු ගණන*
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය	රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව	යාපනය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය	කාර්යාල සේවක සේවයේ III ශ්‍රේණියේ කාර්යාල කම්කරු	04
		කිලිනොච්චි ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය		02
		මුලතිව් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය		03
		වව්නියා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය		01
		මන්නාරම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය		01
		ලේඛනාගාරය (වව්නියාව)		02

ඇමුණුම 02

ආදර්ශ අයදුම්පත්‍රය

කාර්යාල සේවක සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

අයදුම්කරන භාෂා මාධ්‍යය

සිංහල	
දෙමළ	
ඉංග්‍රීසි	

1. මුලකුරු සමග නම (සිංහලෙන්) : ..... මයා/මිය/මෙය
2. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්) : Mr./ Mrs./ Miss .....

3. මුලකුරු වලින් හැඳින්වෙන නම් (සිංහලෙන්) : .....

4. ජාතික හැඳුනුම්පත් අංකය :

5. උපන් දිනය : **වර්ෂය:** **මාසය:** **දිනය:**

6. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට (2026.11.20) වයස: **අවු:** **මාස:** **දින:**

7. ස්ථිර ලිපිනය : .....

8. පදිංචි දිස්ත්‍රික්කය : .....

9. දුරකථන අංකය : නිවස: ජංගම:

10. විද්‍යුත් තැපැල් ලිපිනය: .....

11. අධ්‍යාපන සුදුසුකම් :

I. පළමුවර ප්‍රතිඵල : වර්ෂය ..... මාසය .....

විෂයය	*ශ්‍රේණිය*	*විෂයය*	*ශ්‍රේණිය*
1.		6.	
2.		7.	
3.		8.	
4.		9.	
5.		10.	

II. දෙවනවර ප්‍රතිඵල : වර්ෂය ..... මාසය .....

විෂයය	*ශ්‍රේණිය*	*විෂයය*	*ශ්‍රේණිය*
1.		6.	
2.		7.	
3.		8.	
4.		9.	
5.		10.	

11.1 අ.පොස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

විභාගයේ වර්ෂය හා මාසය : ..... විභාග අංකය : .....

ප්‍රතිඵල

විෂයය	*ශ්‍රේණිය*
1.	
2.	
3.	
4.	

12. වෙනත් සුදුසුකම් : .....
.....

13. තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද : .....
.....

14. ක්‍රීඩා හා බාහිර ක්‍රියාකාරකම් : .....
.....

15. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?

(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න) ඔව් ☐ නැත ☐

16. අයදුම්කරුගේ සහතිකය :

(අ.) මෙම ඉල්ලුම්පත්‍රයේ ම විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/ හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදු විය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. තව ද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ.) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(ඇ.) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය : ....,
අයදුම්කරුගේ අත්සන.

10 - 819

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ඇබෑර්තු

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමග **2026.11.16** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ"** යන ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන් පමණක්** එවිය යුතු ය. තමන් අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතු ය. (මෙම තොරතුරු www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකි ය).

1. කනිෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති තනතුර (පුරප්පාඩු සංඛ්‍යාව - 01)

1.1 වැටුප් පරිමාණය :

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 54,560- 3x680/ 10x800/ 4x1,190 - රු. 69,360/-වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 96,000.00 පමණ වේ.)

1.2 වයස් සීමාව :

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 40 ට නොවැඩි විය යුතු ය.

1.3 සුදුසුකම් :

1.3.1 අධ්‍යාපන: විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම;

සහ

වෘත්තීය: පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාවේ පළමුවැනි කොටස සම්පූර්ණ කර තිබීම;
(ලබා ඇති උපාධිය පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ උපාධියක් නම්, වෘත්තීය සුදුසුකම් අනිවාර්ය නොවේ).

සහ

පළපුරුද්ද: ඉහත සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු මහජන පුස්තකාලයක/ පාර්ලිමේන්තු පුස්තකාලයේ පුස්තකාල සහකාර තනතුරක වසර තුනක (03) පළපුරුද්ද;

හෝ

1.3.2 අධ්‍යාපන: අ.පො.ස. (උසස් පෙළ) විභාගය (පැරණි විෂය නිර්දේශය) විෂයයන් හතරකින් (04)/ (නව විෂය නිර්දේශය) විෂයයන් තුනකින් (03) එකවර සමත් වී තිබීම;

සහ

සිංහල/දෙමළ, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව දෙවතාවකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වී තිබීම;

සහ

වෘත්තීය: පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාවක II වැනි මට්ටම සම්පූර්ණ කර තිබීම;

සහ

පළපුරුද්ද: ඉහත සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු මහජන පුස්තකාලයක/ පාර්ලිමේන්තු පුස්තකාලයේ පුස්තකාල සහකාර තනතුරක වසර පහක (05) පළපුරුද්ද;

හෝ

1.3.3 අධ්‍යාපන: සිංහල/දෙමළ, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව දෙවතාවකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වී තිබීම;

සහ

වෘත්තීය: පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාවක III වැනි මට්ටම සම්පූර්ණ කර තිබීම;

සහ

පළපුරුද්ද: ඉහත සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු මහජන පුස්තකාලයක/පාර්ලිමේන්තු පුස්තකාලයේ පුස්තකාල සහකාර තනතුරක වසර හතක (07) පළපුරුද්ද.

1.4 බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක කුසලතාව මඟිනි.

1.5 ඇගයීමේ පටිපාටිය :

1.5.1 **ලිඛිත පරීක්ෂණය:** රැකියා කාර්යභාරය සහ වගකීම සම්බන්ධව අයදුම්කරුගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බලනු ලබන අතර, ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියයකි (100).

1.5.2 සම්මුඛ පරීක්ෂණය: පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

1.5.3 ලිඛිත පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු මත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේ දී පහත නිර්ණායකයන් අනුව ලකුණු ලබා දෙනු ලැබේ. මෙහි දී ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියයකි (100):

	නිර්ණායක
i	අමතර අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්
ii	පරිගණක සාක්ෂරතාව
iii	සේවා පළපුරුද්ද
iv	සන්නිවේදන කුසලතාවය හා භාෂා නිපුණත්වය
v	සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව

2. ගෘහභාණ්ඩ ඔපකරු තනතුර (පුරප්පාඩු සංඛ්‍යාව - 01)

2.1 වැටුප් පරිමාණය :

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා වක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු.47,240- 9x540 /10 x 590 /3x680 - රු. 60,040/- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 87,000/- පමණ වේ).

2.2 වයස් සීමාව :

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 40 ට නොවැඩි විය යුතු ය.

2.3 සුදුසුකම් :

2.3.1 **අධ්‍යාපන:** සිංහල/දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ද, ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද සහිතව දෙවතාවකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් හයකින් (06) සමත්වී තිබීම;

සහ

වෘත්තීය: වඩු ශිල්ප (ගෘහභාණ්ඩ ඔපකරු) ක්ෂේත්‍රයට අදාළව NVQ III සහතිකයක් ලබා තිබීම;

සහ

පළපුරුද්ද: පිළිගත් ආයතනයක ගෘහභාණ්ඩ ඔපකරණ ක්ෂේත්‍රයේ තනතුරක අවම වසර තුනක (03) පළපුරුද්දක් ලබා තිබීම;

හෝ

2.3.2 අධ්‍යාපන: සිංහල/දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ද, ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද සහිතව දෙවතාවකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් හයකින් (06) සමත්වී තිබීම;

සහ

පළපුරුද්ද: පිළිගත් ආයතනයක ගෘහභාණ්ඩ ඔපකරණ ක්ෂේත්‍රයේ තනතුරක අවම වසර පහක (05) පළපුරුද්දක් ලබා තිබීම.

2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක කුසලතාවය මගිනි.

2.4.1 **වෘත්තීය පරීක්ෂණය:** ගෘහභාණ්ඩ ඔපකරණ ක්ෂේත්‍රයට අදාළ කුසලතා පරීක්ෂා කරනු ලැබේ.

2.4.2 **සම්මුඛ පරීක්ෂණය:** වෘත්තීය පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ. මෙහි දී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියය (100) කි.

	නිර්ණායක
i	අමතර අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම්
ii	විෂය දැනුම
iii	පළපුරුද්ද
iv	පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා

3. ආහාරපාන සහායක තනතුර (පුරප්පාඩු සංඛ්‍යාව - 08)

3.1 වැටුප් පරිමාණය

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා වක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 47,240-9x 540/10x 590/3 x 680- රු. 60,040 වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 90,000.00 පමණ වේ).

3.2 අධ්‍යාපන සුදුසුකම් :

සිංහල හෝ දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථයක් ද, ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයන්ද සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වී සිටීම.

3.3 වෘත්තීය සුදුසුකම් :

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) / ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA)/ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ (VTA) හෝ ඒ හා සමාන වෘත්තීය පුහුණු ආයතනයක පාඨමාලා කාලය වසරකට නොඅඩු මූලික හෝජනාගාර සේවා පාඨමාලාවක් / ආහාරපාන සේවා පාඨමාලාවක් හදාරා එය සාර්ථකව නිමකොට තිබීම.

3.4 පළපුරුද්ද :

ඉහත 3.2 සහ 3.3 හි සඳහන් අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, තරු පංතියේ හෝටලයක/පිළිගත් ආයතනයක හෝජනාගාර සේවක/ ආහාරපාන සහායක තනතුරක වසර දෙකකට නොඅඩු කාලයක් සේවය කර තිබීම.

3. 5 වයස් සීමාව :

අයදුම්පත් භාරගැනීම අවසන් වන දිනට වයස අවුරුදු 22 ට නො අඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

3.6 බඳවා ගැනීමේ ක්‍රමය :

වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

3.6.1 වෘත්තීය පරීක්ෂණය

ඉහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් වෘත්තීය පරීක්ෂණයකට සහභාගී විය යුතුය. මෙම පරීක්ෂණය මඟින් ආපනශාලා සේවා පිළිබඳ අයදුම්කරුවන්ගේ කුසලතා ඇගයීමට ලක් කෙරේ. මෙම පරීක්ෂණය සඳහා ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියය (100) කි.

3.6.2 සම්මුඛ පරීක්ෂණය

පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පහත සඳහන් නිර්ණායක පාදක කර ගනිමින් සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහිදී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියය (100)කි.

	නිර්ණායක
i.	අමතර අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම්
ii.	විෂය දැනුම
iii.	අමතර පළපුරුද්ද
iv.	පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා

4. සේවා නියමයන් හා කොන්දේසි

4.1 මෙම තනතුරු ස්ථීර ය. විශ්‍රාම වැටුප් සහිත ය. තෝරාගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථීර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවය ස්ථීර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

4.2 පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පාර්ලිමේන්තුවේ මහ ලේකම්ට බලය ඇත.

4.3 තෝරාගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

4.4 තෝරාගනු ලබන අයදුම්කරුවන් රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු හා අනත්දරු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතු ය.

4.5 තෝරාගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතු ය.

4.6 තෝරාගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිෂ්කාශන වාර්තා ලබා ගනු ඇත.

5. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් **(මුල් පිටපත් නොවේ)** සිය අයදුම්පත්වලට අමුණා එවිය

යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(අ) උප්පැන්න සහතිකය;
(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
(ඇ) වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික.

6. රාජ්‍ය/ පළාත් රාජ්‍ය ආයතනවල සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා එවිය යුතු ය.

7. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුරු සඳහා නුසුදුසුකමක් වනු ඇත.

8. අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර හෝ කරුණක් වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

9. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් හරහා යොමු කරනු නොලබන අයදුම්පත් (දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරනු ලබන්නේ නම්) ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

කුෂානි රෝහණදීර,
පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

2026 ඔක්තෝබර් මස 26 වැනි දින,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ආදර්ශ අයදුම්පත

..... තනතුර

01. (අ) මුලකුරු සමඟ නම (**සිංහලෙන්**):- .....
.....
.....

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් (**සිංහලෙන්**):- .....
.....
.....

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :-(Mr./Mrs. /Miss.).....
.....
.....

02. ජාතික හැඳුනුම්පත් අංකය:- | | | | | | | | | | | | |

03. (අ) i). පෞද්ගලික ලිපිනය :-.....
.....
.....

ii). දුරකථන අංකය:- | | | | | | | | | | |

iii). WhatsApp දුරකථන අංකය:- | | | | | | | | | | |

iv). විද්‍යුත් තැපැල් (e-mail) ලිපිනය:-.....

(ආ) i). කාර්යාලයීය ලිපිනය :- .....
.....
.....

ii). කාර්යාලයීය දුරකථන අංකය:- | | | | | | | | | | |

(ඇ) ප්‍රවේශ පත්‍රය තැපැල් කළ යුතු ලිපිනය :

පෞද්ගලික : ☐ කාර්යාලයීය : ☐

04. (අ) උපන් දිනය:- ..... (උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා තිබිය යුතුය)

(ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :- අවුරුදු ..... මාස:-..... දින:-.....

05. විවාහක/ අවිවාහක බව :- (විවාහක/ අවිවාහක)

06. ස්ත්‍රී/ පුරුෂ භාවය :- (ස්ත්‍රී/ පුරුෂ)

07. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව :- (ඔව්/ නැත)

08. අධ්‍යාපන සුදුසුකම්:- (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)

(අ) අ.පොෂ. (සා.පෙළ)

විෂයයන්	*සාමාර්ථය*	*වර්ෂය*
සිංහල/දෙමළ		
ඉංග්‍රීසි		
ගණිතය		

(ආ) අ.පොෂ. (උ.පෙළ)

විෂයයන්	*සාමාර්ථය*	*වර්ෂය*

(ඇ) උපාධිය පිළිබඳ විස්තර :

i). උපාධිය ලද දිනය : .....
ii). විශ්වවිද්‍යාලය / ආයතනය : .....
iii). උපාධිය : .....
iv). විෂයයන් : .....

09. වෘත්තීය සුදුසුකම්:- (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)

පාඨමාලාව	*ආයතනය*	*කාල පරිච්ඡේදය*	*ක්‍රියාත්මක වන දිනය*

10. පළපුරුද්ද:- (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)

ආයතනය	**තනතුර**	**සේවා කාලය**

11. වෙනත් සුදුසුකම් (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය):- .....
.....
.....

12. වත්මන් රැකියාව පිළිබඳ විස්තර (අදාළ ලේඛන ඇමිණිය යුතු ය) :-

(අ) ආයතනයේ නම හා ලිපිනය .....
.....

(ආ) මුල් පත්වීමේ දිනය:-.....

(ඇ) දැනට දරන තනතුර:-.....

(ඈ) මාසික මූලික වැටුප :-.....

(ඉ) දීමනා :-.....

(ඊ) දළ වැටුප:-.....

13. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද? (ඔව්/නැත)
එසේ නම්, ඒ පිළිබඳ විස්තර දක්වන්න:-
.....

14. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද? (ඔව්/නැත)
එසේ නම්, එම විස්තර සඳහන් කරන්න.
.....

ම විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත්, වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතු වන බව දනිමි.

දිනය :- ....,
අයදුම්කරුගේ අත්සන.

දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය

(රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ නියුතු, අයදුම්කරුවන් සඳහා පමණි.)

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ .....තනතුර දරන,.....මයා/මිය/මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු/ ඇය මෙම තනතුරෙහි ස්ථිර කර ඇති/ නොමැති බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම් සතුටුදායක බවත්, ඔහුට හෝ ඇයට එරෙහිව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/ නොහැක. (කරුණාකර අනවශ්‍ය වචන කපා හරින්න.)

දිනය :-..... .....,
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

10- 851

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ II ශ්‍රේණියේ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් බඳවා ගැනීමේ නිවේදනය 2025

ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථාව අනුව දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි (II ශ්‍රේණිය) තනතුරේ පවත්නා පුරප්පාඩු සේවා ප්‍රමුඛතාවය මත හඳුනාගත් තනතුරු 85ක් සඳහා බඳවා ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියෝගය පරිදි සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් මෙහි 04 වන ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරන දන්ත ශල්‍ය වෛද්‍ය උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ ඇමුණුම් ලෙස පුරප්පාඩු ලේඛනය, අභිමතය ප්‍රකාශ කිරීමේ ආකෘති පත්‍රය හා අයදුම්පත ප්‍රසිද්ධ කොට ඇත. අයදුම්පත් භාර ගැනීම 2026 නොවැම්බර් මස 08 වන දින සිදු කෙරේ.

02. මෙම තනතුරට හිමි වැටුප් පරිමාණය - රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව මාසිකව, රු. 91,750-3 X 2,400 – 7×2,420– 2×2,940– 16×3,900- රු. 184,170 (SL 2-2025). මෙයට අමතරව රාජ්‍ය හා දෙපාර්තමේන්තු චක්‍රලේඛ වලින් සපයා ඇති ප්‍රතිපාදන අනුව ගෙවන දීමනාද ඇතුලත් වේ. කෙසේ වුව ද ඔබ විසින් මෙම වැටුප් පරිමාණයේ 03 වන වැටුප් පියවරට එළඹීමට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.

03. මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන් වලට ඔබ යටත් විය යුතු

වේ. තව ද, ඔබගේ පත්වීම, පත්වීම් ලද දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ය. රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝගවලටද, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ආයතන සංග්‍රහයේ විධාවිධානවලටද, මුදල් රෙගුලාසිවලටද, රජය විසින් කළින් කලට නිකුත් කරනු ලබන රෙගුලාසිවලට සහ නියෝගවලට ද ඔබගේ පත්වීම යටත්ය. තව ද, පත්වීම ලද දිනයේ සිට වසර 03 ක් ඉකුත් වීමට පෙර 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි විධිවිධාන අනුව රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ඔබ විසින් ලබා ගත යුතු අතර එසේ නැතහොත් වැටුප් වර්ධක අත්හිටුවනු ඇත.

04. මෙම බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබන්නේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගන්නා විශ්වවිද්‍යාලයකින් දන්ත ශල්‍ය වෛද්‍ය උපාධිය ලබා ඒකවාර්ෂික සීමාවාසික පුහුණුව සාර්ථකව අවසන් කොට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබාගත් දන්ත ශල්‍ය වෛද්‍යවරුන්ය. මෙම පත්වීම සඳහා බඳවා ගැනීමට කුසලතා ලේඛනය සකස් කිරීමේ දී ප්‍රමුඛතාවය ලබාදෙනු ලබන්නේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දන්ත වෛද්‍ය පීඨයේ දන්ත ශල්‍ය වෛද්‍යවේදී උපාධිය ලත් දන්ත ශල්‍ය වෛද්‍යවරුන් එම පීඨයෙන් නිකුත් කළ කුසලතා ලේඛනයට අනුකූලව සහ ඉන් පසුව විදේශීය විශ්වවිද්‍යාල වෙතින් දන්ත ශල්‍ය වෛද්‍ය උපාධිය ලබාගත් දන්ත ශල්‍ය වෛද්‍යවරුන් සඳහා ශ්‍රී ලංකා වෛද්‍ය සභාව ලබාදෙන කුසලතා අනුපිළිවෙළ අනුව ය.

05. උපාධිධාරීන්ගේ අයදුම්පත්, කුසලතා ලේඛනයේ අනුපිළිවෙලට අනුව සලකා බලනු ලැබේ. එම කුසලතා ලේඛනය ඇමුණුම II ලෙස මෙම නිවේදනයට අමුණා ඇත.

06. ඉල්ලුම්කරුවන් පහත සඳහන් ලේඛන හෝ පිටපත් (දන්වා ඇති පිටපත් ගණන අනුව) ස්වකීය ඉල්ලුම්පත්‍රයට අමුණා 2026 නොවැම්බර් 08 වැනි දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කළ යුතු ය.

අධ්‍යක්ෂ (දන්ත සේවා),
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
අංක 106, ඩඩ්ලි සේනානායක මාවත,
කොළඹ 08.*

(අ) උප්පැන්න සහතිකයේ මුල් පිටපත් තුනක් (03)**
(ආ) ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකයේ ඡායා පිටපත් තුනක් (03)
(ඇ) ජාතික හැඳුනුම්පතේ දෙපසම දැක්වෙන පරිදි ලබා ගත් ඡායා පිටපත් තුනක් (03)
(ඈ) උප්පැන්න සහතිකයේ හා ජාතික හැඳුනුම්පතේහි ඉංග්‍රීසි පරිවර්තන පිටපත් (03)
(රජයේ ලියාපදිංචි භාෂා පරිවර්තකයෙකුගෙන් ලබාගත්)*

07. ඉන්පසු 2026 නොවැම්බර් 09 දින අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කොට ඇති ලේඛන වල මුල් පිටපත් අධ්‍යක්ෂ (දන්ත සේවා) කාර්යාලයේ නිලධාරීන් විසින් පරීක්ෂාකර සත්‍ය පිටපත් ලෙස තහවුරු කරනු ලැබේ. ඒ සඳහා සියලුම සහතික වල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු අතර එම මුල් පිටපත් පරීක්ෂාකර අවසන් වූ විගස අයදුම්කරුවන් වෙත ආපසු ලබා දෙනු ඇත. මෙම සියලු ලේඛන වල නිරවද්‍යතාවය තහවුරු කිරීමෙන් පසු මනාප ස්ථාන තෝරා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භවනු ඇත.*

08. මෙම නිවේදනයට පහත සඳහන් ලේඛන ඇතුළත්ය.

8.1 අයදුම්පත්‍රය (සිංහල/දෙමළ) - ඇමුණුම I
8.2 කුසලතා ලේඛනය (ඉංග්‍රීසි) - ඇමුණුම II
8.3 පුරප්පාඩු ලේඛනය (ඉංග්‍රීසි) - ඇමුණුම III
8.4 අභිමතය ප්‍රකාශ කිරීමේ ආකෘති පත්‍රය (ඉංග්‍රීසි) - ඇමුණුම IV
එම සියලුම ලේඛන නිසි පරිදි සම්පූර්ණ කොට එවන ලෙස උපදෙස් දෙනු ලැබේ.

09. අභිමතය ප්‍රකාශ කිරීමේ ආකෘති පත්‍රයේ තමා කැමති සේවා ස්ථානය ලකුණු කිරීමේ දී තම කුසලතා අංකයට සමාන හෝ වැඩිපුර සේවා ස්ථානයන් ප්‍රමාණයක් නම්කරන ලෙසට සියලුම අයදුම්කරුවන්ට මෙයින් උපදෙස් දෙනු ලැබේ.

10. අදාළ අයදුම්පත්‍රය අධ්‍යක්ෂ (දන්ත සේවා) විසින් මුද්‍රා තැබූ පසු අභිමතය ප්‍රකාශ කිරීමේ ලේඛනයෙහි ඇති ප්‍රමුඛතා ලැයිස්තුව සංශෝධනය කිරීමට අවසර ලබා දෙනු නොලැබේ.

11. විශේෂ අවස්ථා යටතේ කරනු ලබන ඉල්ලීම් වල ස්වභාවය අනුව විවාහ සහතිකය (මුල් පිටපත්) ඉදිරිපත් කිරීමට සිදුවිය හැකිය.

12. අත්‍යවශ්‍ය අවස්ථාවක දී පමණක් තොරතුරු දැන ගැනීම සඳහා දුරකථන අංක 0706491306 ඇමතිය හැකිය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවෙහි අනුමැතිය පරිදි,

විශේෂඥ වෛද්‍ය. අනිල් ජාසිංහ,
ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2026 ඔක්තෝබර් මස 21 වැනි දින,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

*** අංක 07 හි සඳහන් අවසන් දිනයට (2026.11.08) අයදුම්පත්‍රය හා අභිමතය ප්‍රකාශ කිරීමේ ලේඛනය ලියාපදිංචි තැපෑලෙන් ඒවිය යුතු ය. (අංක 06 හි සඳහන් ලේඛන අයදුම්කරුවන් අධ්‍යක්ෂ (දන්ත සේවා) වෙත මේ වන විට ලබා දී තිබෙනම් නැවත ලබා දිය යුතු නොවේ)**

Annexure - I

II ශ්‍රේණියේ දන්ත ශල්‍ය වෛද්‍ය තනතුර සඳහා ඉල්ලුම්පත්‍රය -2025

සෞඛ්‍ය හා ජන මාධ්‍ය අමාත්‍යාංශය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා
කුසලතා අංකය .....
පත් කරන ලද සේවා ස්ථානය .....
පරීක්ෂා කළේ.....
බලය පවරන ලද්දේ.....

01. සම්පූර්ණ නම : .....
.....

(ඔබ ඉහත සඳහන් කළ නම හා පේරාදෙණිය දන්ත වෛද්‍ය පීඨයෙන් ඉදිරිපත් කර ඇති කුසලතා ලේඛනයේ සඳහන් නම හෝ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකයේ දැක්වෙන නම අතර වෙනසක් තිබේ නම් කරුණාකර ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන්න.)

02. මුලකුරු සහිත නම :.....

03. ජාතික හැඳුනුම්පත් අංකය :.....

04. උපාධිය ලැබූ වසර සහ මාසය :.....

05. උපාධිය ලද දන්ත වෛද්‍ය පීඨය හා රට :.....

06. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංකය:.....

07. ලිපිනය:.....
.....

08. දුරකථන අංකය:..... ජංගම .....

09. කාණ්ඩය: දෙවන ශ්‍රේණිය - දන්ත ශල්‍ය වෛද්‍ය

ඉහත මා විසින් සපයා ඇති සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මා විසින් සඳහන් කළ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට තහවුරු වුවහොත් මාගේ අයදුම්පත ප්‍රතික්ෂේප වන බවද අවබෝධ කර ගෙන සිටිමි. තව ද, අභිමතයන් ප්‍රකාශ කිරීමේ ආකෘති පත්‍රයෙහි මා විසින් සඳහන් කළ ස්ථාන අනුපිළිවෙල අයදුම්පත් කැඳවන අවසන් දිනට පසු කිසිදු හේතුවක් මත වෙනස් කළ නොහැකි බවද අවබෝධ කර ගෙන සිටින බවට මෙයින් සහතික වෙමි.

....,
දිනය අයදුම්කරුගේ අත්සන.

Annexure - II

Merit Order - 2025

Rank	***Name***	***Status of SLMC Registrarion***
01	Merennage Hansini Kavindra De Costa	Completed
02	Ambagahawaththa Kankanamge Hasini Samadhi Sathsara	Completed
03	Manachchuge Chamathka Thambaravee Hewapathirana	Completed
04	Henadeerage Don Sachithra Sandaruwan Senadeera	Completed
05	Bandaranayake Mudiyanselage Pabasara Bandaranayake	Completed
06	Thalwatte Dissanayakage Oshadi Nuwanthra Dissanayaka	Completed
07	Mohammed Fazy Fathima Fazna	Completed
08	Welihinda Badalage Shamodhi Awanka	Completed
09	Weerasooriyage Piumi Malshani	Completed
10	Vidanelage Maneesha Nadeshani De Mel	Completed
11	Herath Mudiyanselage Geethma Amandi Senarathna	Completed
12	Rajjama Hewage Sashiprabha Anurangi Waidyarathna	Completed
13	Amarathunge Arachchige Pushpi Shalika	Completed
14	Udawattage Udadhie Rusara Leelananda	Completed
15	Dissanayake Mudiyanselage Nethmi Rajika Dissanayake	Completed
16	Sithmi Chamathya Samaraweera	Completed
17	Aruggoda Gamage Thushara Sithijaya	Completed
18	Modarage Rumesha Pradeepani De Silva	Completed
19	Thiyagarajah Suwathijah	Completed
20	Rajenthiram Thivaharan	Completed
21	Mudiyanselage Gedara Kavindi Sewwandika Abeyrathne	Completed
22	Weerasinghe Arachchige Pabodha Upamal Weerasinghe	Completed
23	Ilukketiya Mudiyanselage Iresha Dilrukshi Bandara	Completed
24	Rathnayaka Mudiyanselage Navoda Tharindu Lakmal	Completed
25	Vidanage Dona Rangika Madushani Rathnayake	Completed
26	Badugodahewa Hirushi Ariyarathne	Completed
27	Lasan Geenila Dahanayake	Completed
28	Basnayake Mudiyanselage Sanjeewani Kumari Basnayake	Completed

Rank	*Name*	*Status of SLMC Registrarion*
29	Yahampath Arachchige Upulika Prabodhani Perera	Completed
30	Sachini Mekhala Haputhanthri	Completed
31	Siyambalagahawatta Kankanamge Ranjana Priyashani	Completed
32	Galle Gedara Anuradha Shanaka Bandara	Completed
33	Liyana Pathirannahalage Pubudu Varuna	Completed
34	Chathumi Sachintha Senanayake	Completed
35	Nabadawa Vithanage Anuththara Madhumali	Completed
36	Subodha Madhumadhavi Hettiarachchi	Completed
37	Tharmanandasivam Naveenan	Completed
38	Marasinghe Mudiyanselage Dilshani Raveesha Marasinghe	Completed
39	Udugama Sooriyaarachchige Ganindu Kavithra	Completed
40	Jaltotage Nimantha Saranapala	Completed
41	Otunu Pandithage Krishani Ruwanthika	Completed
42	Haseem Fathima Nufla	Completed
43	Pahalage Anjalee Ama Merusinghe	Completed
44	Pasupathyarajah Prashanth	Completed
45	Bandaranayake Mudiyanselage Dananjaya Banadaranayake	Completed
46	Murukkuwadura Udara Madhuwanthi Mendis	Completed
47	Rajapaksha Mudiyanselage Lakshmi Wijayasingha	Completed
48	Nuwarapakshage Prabhashi piyumali	Completed
49	Yapa Mudiyanselage Sewwandi Imalsha Bandara	Completed
50	Herath Pathiranage Achini Madushani Wickramasingha	Completed
51	Karthigesu Pirasanth	Completed
52	Daham Thejana Thenuwaragamage	Completed
53	Raveesha Jayasekara Gamage	Completed
54	Thalpe Hewage Suresh Manjula	Completed
55	Rathnayake Mudiyanselage Yasanthi Prabhavi Rathnayake	Completed
56	Weerakkodi Mohottige Dona Piumi Nawanjana Ranasinghe	Completed
57	Ihala Wanni Arachchilage Puthula Nadun Palipana	Completed
58	Arulanandem Arudpraveen	Completed

Rank	*Name*	*Status of SLMC Registrarion*
59	Sameera Bhathiya Priyashan Kalansooriya	Completed
60	Athugala Pathiranalage Raveena Anjalee Athugala	Completed
61	Yogalingam Thuvaraka	Completed
62	Mohamed Wasim Rusthum	Completed
63	Rusiru Upendra Ariyasinghe Kulatilake	Completed
64	Hewage Prabodi Rajini Weerasinghe	Completed
65	Rathnayake Mudiyanselage Imali Navanjali Rathnayake	Completed
66	Gajanayaka Mudiyanselage Dilini Maheshika Karunarathna	Completed
67	Dissanayake Mudiyanselage Sithara Harshani Dissanayaka	Completed
68	Henrich Ravi Ann Piyanthi	Completed
69	Thiyagarajah Usankan Prasath	Completed
70	Jayasinghage Ayesha Sangeeth Jayasingha	Completed
71	Imesha Madhushani Bimalka Vithana	Completed
72	Sasivannan Tharujan	Completed
73	Amalanathan Eric Vidhyashagar	Completed
74	Liyana Arachchige Buddhika Prabhath Liyanaarachchi	Completed
75	Muhammadhu Mahir Fathima Raisa	Completed
76	Delaxshana Tharmarajah	Completed
77	Mohamed Arooz Fathima Asara	Completed
78	Natkunanathan Mithusha	Completed
79	Amalini Kulakshi Marye Dissanayake	Completed
80	Ponrajah Anton Reginold Thivaharan	Completed
81	Nivethithan Thambirajah	Completed
82	Anjana Rajeewa Dissanayake	Completed
83	Kahandugoda Manage Thathsarani Nayanaprabha Wijerathne	Completed
84	Thisumi Bimasara Pitagampala	Completed
85	Brindha Ganeshan	Completed
	Total	**85**

Annexure - III

Recruitment of Post Intern Dental Graduates to the Post of Dental Surgeon (Grade II)

Ministry Of Health and Mass Media - Sri Lanka - 2025

Serial No.	*Name of the Institution*	*Vacancy*	*Administrative Authority*	*District*
Central Province				
01	DGH - Nuwaraeliya DS	01	Line Ministry	Nuwaraeliya
02	DH - Nildandahinna DS	01	RDHS	Nuwaraeliya
03	DH - Walapane DS	01	RDHS	Nuwaraeliya
04	DH - Lindula Ds	01	RDHS	Nuwaraeliya
05	DH - Gonaganthanna DS	01	RDHS	Nuwaraeliya
06	DH -Agarapathana DS	01	RDHS	Nuwaraeliya
07	DH - High Forest	01	RDHS	Nuwaraeliya
08	BH - Dickoya DS	01	RDHS	Nuwaraeliya
Provincial Total (Central)		**08**		
Eastern Province				
09	DGH - Ampara HO OMF	02	Line Ministry	Ampara
10	DGH - Ampara DS	01	Line Ministry	Ampara
11	BH - Mahaoya DS	02	RDHS	Ampara
12	DH - Panama DS	01	RDHS	Ampara
13	DH - Wadinagala DS	01	RDHS	Ampara
14	BH - Kattankudy DS	01	RDHS	Batticaloa
15	BH - Valachenai DS	01	RDHS	Batticaloa
16	DH - Palugamam DS	01	RDHS	Batticaloa
17	BH - Kalawanchikudy DS	01	RDHS	Batticaloa
18	RDHS Office Batticaloa Mobile Relief DS	01	RDHS	Batticaloa
19	BH - Thirukkovil DS	01	RDHS	Batticaloa
20	BH - Pothuvil DS (OPD)	01	Line Ministry	Kalmunai
21	DH - Central camp DS RDHS	01	RDHS	Kalmunai
22	BH - Kanthale DS	01	RDHS	Trincomale
Provincial Total (Eastern)		**16**		
Northern Province				
23	RDHS Office Kilinochchi Regional Dental Surgeon	01	RDHS	Kilinochchi
24	DGH - Vavuniya HO OMF	01	Line Ministry	Vavuniya
25	DH - Delft DS	01	RDHS	Jaffna
26	DGH Mulativu DS	01	RDHS	Mulativu

Serial No.	*Name of the Institution*	*Vacancy*	*Administrative Authority*	*District*
27	DH - Silawathura DS	01	RDHS	Mannar
28	RDHS Office Relief DS	01	RDHS	Mannar
Provincial Total (Northern)		**06**		
	North Central Province			
29	DGH - Polonnaruwa HO RESTO	02	Line Ministry	Polonnaruwa
30	DGH - Polonnaruwa HO OMF	02	Line Ministry	Polonnaruwa
31	DH - Aththanakadawala DS	01	RDHS	Polonnaruwa
32	DH - Diyabeduma DS	01	RDHS	Polonnaruwa
33	DH - Jayanthipura DS	01	RDHS	Polonnaruwa
34	MOH - Aralaganwila DS	01	RDHS	Polonnaruwa
35	RDHS Office Polonnaruwa DS	01	RDHS	Polonnaruwa
36	TH - Anuradhapura HO ORTHO	01	Line Ministry	Anuradhapura
37	DH - Nochchiyagama DS	01	RDHS	Anuradhapura
38	DH - Galnewa DS	01	RDHS	Anuradhapura
39	DH - Mahawilachchiya DS	01	RDHS	Anuradhapura
40	DS - Rathmalgahawewa DS	01	RDHS	Anuradhapura
Provincial Total (North Central)		**14**		
	North Western Province			
41	DH - Rajanganaya Tract 3 (Kurunegala) DS	01	RDHS	Kurunegala
42	DH - Meegalewa DS	01	RDHS	Kurunegala
43	DH - Kotawehera	01	RDHS	Kurunegala
44	DH - Nikawewa DS	01	RDHS	Kurunegala
45	DH - Mundel also to cover up DH Madurankuliya DS	01	RDHS	Puttalam
46	DH - Kottukachchiya Ds	01	RDHS	Puttalam
47	RDHS Puttalam Relife Dental Surgeon	01	RDHS	Puttalam
Provincial Total (North Western)		**07**		
	Sabaragamuwa Province			
48	DH - Madampe (Rathnapura) DS	01	RDHS	Rathnapura
49	DH Sooriyakanda DS	01	RDHS	Rathnapura
50	DH- Dumbara DS	01	RDHS	Rathnapura
51	DH - Rakwana DS	01	RDHS	Rathnapura
52	DH- Endana DS	01	RDHS	Rathnapura
53	DH - Marathenna DS	01	RDHS	Rathnapura
54	DH - Rassagala DS	01	RDHS	Rathnapura

Serial No.	*Name of the Institution*	*Vacancy*	*Administrative Authority*	*District*
55	DH - Kiriporuwa (Kegalle) DS	01	RDHS	Kegalle
56	DH - Deraniyagale	01	RDHS	Kegalle
Provincial Total (Sabargamuwa)		**09**		
Southern Province				
57	DH - Neluwa DS	01	RDHS	Galle
58	DH-Urubokka DS	01	RDHS	Matara
59	DH - Kariyamaditha DS	01	RDHS	Hambanthota
60	ADC - ST Mary Collage (Hambathota) DS	01	RDHS	Hambanthota
Provincial Total (Southern)		**04**		
Uva Province				
61	TH - Badulla DS	01	Line Ministry	Badulla
62	TH - Badulla HO OMF	02	Line Ministry	Badulla
63	BH - Mahiyanganaya DS	01	Line Ministry	Badulla
64	TH - Badulla HO ORTHO	01	Line Ministry	Badulla
65	RDHS Office Badulla Relief DS	01	RDHS	Badulla
66	DH - Mahadowa Placed at PMCU Ballaketuwa	01	RDHS	Badulla
67	MOH - Haldumulla DS	01	RDHS	Badulla
68	DH - Wewegama DS	01	RDHS	Badulla
69	DH - Hopton DS	01	RDHS	Badulla
70	BH - Mahiyanganaya DS	01	RDHS	Badulla
71	RDHS Office Monaragala Mobile Relife DS	01	RDHS	Monaragala
72	DH - Okkampitiya DS	01	RDHS	Monaragala
73	BH - Siyambalanduwa DS	01	RDHS	Monaragala
74	DH - Badalkumbura DS	01	RDHS	Monaragala
75	DH - Inginiyagala DS	01	RDHS	Monaragala
76	MOH Sevanagala DS	01	RDHS	Monaragala
77	ADC - Dombagahawela M.V. DS	01	RDHS	Monaragala
78	Professor Senaka Bibile Memorial Base Hospital Bibile (Mobile DS)	01	RDHS	Monaragala
79	MOH - Medagama DS	01	RDHS	Monaragala
80	MOH - Bibile DS	01	RDHS	Monaragala
Provincial Total (Uva)		**21**		
Total No. of Appointment		**85**		

විභාග - විභාග ප්‍රතිඵල ආදිය

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

තාක්ෂණ/ කාර්මික විද්‍යාලයන්හි පැවැත්වෙන පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම - 2027

1. මෙම නිවේදනයේ සඳහන් තාක්ෂණ / කාර්මික විද්‍යාලවල පැවැත්වෙන පාඨමාලා සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් අතුරින් ඔවුන්ගේ සුදුසුකම් හා කුසලතාවයන් සැලකිල්ලට ගෙන පාඨමාලා සඳහා සිසුන් බඳවා ගනු ලැබේ.

2. මේ පිළිබඳ විස්තර www.dtet.gov.lk වෙබ් අඩවියෙහි පළකර ඇති අතර අයදුම්පත්‍රය එම වෙබ් අඩවිය හරහා හෝ mis.dtet.gov.lk මගින් මාර්ගගත ක්‍රමයට ඉදිරිපත් කළ හැකිය. පාඨමාලා සඳහා අයදුම්පත්‍ර මාර්ගගත ක්‍රමයට ඉදිරිපත් කිරීමට කාරුණික වන්න. එසේ නොහැකි අවස්ථාවන්හිදී පහත පරිදි කටයුතු කරන්න. මෙම දැන්වීමේ දක්වා ඇති "ආදර්ශ අයදුම්පත්‍රයට" අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක අදාළ අයදුම්පත් නිවැරදිව සම්පූර්ණ කර 2026/12/04 වැනි දින හෝ ඊට පෙර අදාළ තාක්ෂණ / කාර්මික විද්‍යාලයේ අධ්‍යක්ෂ / විදුහල්පති වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් අදාළ විද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන අංශයට පැමිණ භාර දීමට අවස්ථාව ඇත. NVQ 5/6 පාඨමාලා සඳහා අයදුම්පත් යොමුකිරීම මාර්ගගත ක්‍රමයට පමණි.

   වැදගත්:- අයදුම්පත් මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට හෝ පුද්ගලික ලිපිනයකට යොමු නොකරන ලෙසට අයදුම්කරුවන් හට උපදෙස් දෙනු ලැබේ.

3. අයදුම්පත යොමු කරන කවරයෙහි වම්පස ඉහළ කෙලවරෙහි ඉල්ලුම් කරන පාඨමාලාවේ නම හා පාඨමාලා කේතය යොදන්න. එක් එක් පාඨමාලා සඳහා වෙන වෙනම අයදුම්පත් යොමු කළ යුතු ය.
   උදා. ඉංජිනේරු ශිල්පීය පුහුණුව පිළිබඳ ජාතික සහතිකය - (කර්මාන්ත ජලනල ශිල්පී) - ECC 82

4. පාඨමාලා සම්බන්ධ වැඩිදුර තොරතුරු වෘත්තීය මාර්ගෝපදේශන අංශයේ 011-2348893 / 0711997111 යන දුරකථන අංක ඇමතීමෙන් හෝ www.dtet.gov.lk යන වෙබ් අඩවියෙන්ද මේ සමඟ ඇති තාක්ෂණ හා කාර්මික විද්‍යාලයන් වල දුරකථන අංක වලට ඇමතීමෙන් ද ලබාගත හැක.

5. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, පාඨමාලාවේ පුරප්පාඩු පවතී නම් පමණක් සලකා බලනු ඇත. ලැබෙන අයදුම්පත් අතරින් පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ සියලු තාක්ෂණ හා කාර්මික විද්‍යාලයන් වල එකම කාල සීමාවක් තුළදී පවත්වනු ලැබේ.

6. ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම් 4, 5 සහ 6 මට්ටමේ සියලුම පූර්ණ කාලීන පාඨමාලාවන් සඳහා කර්මාන්තගත පුහුණුව අනිවාර්ය වේ. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක NVQ Circular :- 05/2022 ට අනුව කර්මාන්තගත පුහුණුව සිදුකරනු ලැබේ.

   I. සියලුම ඩිප්ලෝමා මට්ටමේ (NVQ මට්ටම් 05 හා 06) පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් 03/04 පමණක් පවත්වනු ලැබේ.
   II. භාෂා පාඨමාලා හැර සියළුම NVQ මට්ටම් 03 / 04 පාඨමාලා සිංහල / දෙමළ මාධ්‍යයෙන් පැවැත්වේ.

7. පාඨමාලාවල ස්වභාවය, ඒ ඒ පාඨමාලා සඳහා සපුරා තිබිය යුතු සුදුසුකම්, එම පාඨමාලා පැවැත්වෙන විද්‍යාල සහ පාඨමාලා පැවැත්වෙන භාෂා මාධ්‍යය මෙම දැන්වීමේ අවසානයේ දක්වා ඇති පාඨමාලා පිළිබඳ ලේඛනයෙහි අඩංගු බැවින් එම ලේඛනය කෙරෙහි සියලුම අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ. තාක්ෂණ / කාර්මික විද්‍යාලවල තැපැල් ලිපිනයන් හා දුරකථන අංක ද එම ලැයිස්තුවේ සඳහන් වේ. මෙම අයදුම්පත්‍රය සමඟ සුදුසුකම් වල සහතිකපත් හෝ සහතිකපත්‍ර වල ඡායාපිටපත් ඉදිරිපත් කිරීමෙන් වලකින්න. විද්‍යාලය හෝ පාඨමාලාව මාරුකිරීම සඳහා පසුව කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

8. සියලුම අයදුම්කරුවන් 2026/12/04 දිනට වයස අවුරුදු 16 සම්පූර්ණ වී තිබිය යුතු ය.

9. සියලුම පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වන සිසුන්ගෙන් පහත පරිදි ගාස්තු අය කරනු ලැබේ.

   NVQ මට්ටම් 3 හා 4 පාඨමාලා සඳහා ලියාපදිංචි වීමේදී පාඨමාලා සඳහා රු 1500/= ක ලියාපදිංචි ගාස්තුවක් හා NVQ මට්ටම් 5 හා 6 පාඨමාලා හා භාෂා ක්ෂේත්‍රයේ පාඨමාලා සඳහා ලියාපදිංචි වීමේ දී රු. 2500/= ක ලියාපදිංචි ගාස්තුවක් අය කරනු ලැබේ.

10. අර්ධ කාලීන පාඨමාලා සඳහා ලියාපදිංචි වන සියලුම සිසුන්ගෙන් පහත සඳහන් පරිදි පාඨමාලා ගාස්තු අය කෙරේ.

    I. සමාසික වශයෙන් වර්ගීකරණය කරන ලද ඩිප්ලෝමා පාඨමාලා සඳහා එක් සමාසිකයකට රු.25,000/- මුදලක් ගෙවිය යුතු ය.

II. පාඨමාලා කාලය වසරක් දක්වා වන පාඨමාලා සඳහා මුළු පාඨමාලා ගාස්තුව රු.30,000/- කි.

III. පාඨමාලා කාලය හයමාසික පාඨමාලා සඳහා මුළු පාඨමාලා ගාස්තුව රු.20,000/= කි.

IV. පාඨමාලා කාලය මාස 6ට අඩු පාඨමාලා සඳහා මුළු පාඨමාලා ගාස්තුව රු.15,000/- කි.

ඉහත පාඨමාලා ගාස්තු වාරික දෙකකින් ගෙවිය හැක. ප්‍රථම වාරිකය එම පාඨමාලා ගාස්තුවෙන් අඩක් (1/2) පාඨමාලාවට ලියාපදිංචි වීමේ දී ගෙවිය යුතු අතර, ඉතිරිය පාඨමාලාව ආරම්භ වී හය මාසයක් තුළ ගෙවා අවසන් කල යුතු ය. අවසන් විභාග හෝ ඇගයීම් සඳහා පෙනී සිටීමට පෙර ශිෂ්‍යයා විසින් සම්පූර්ණ පාඨමාලා ගාස්තු ගෙවා අවසන් කළ යුතු ය.

11. මෙම සියලුම ගෙවීම් GOVPAY හරහා සිදුකළ යුතු අතර වැඩිදුර විස්තර අපගේ වෙබ්අඩවියට (www.dtet.gov.lk) පිවිසීමෙන් ලබාගත හැක.

12. උසස් පෙළ විභාගයෙන් විෂයයන් 3ක් සමත් වී තිබීම යනු අදාල විෂය කාණ්ඩයේ ප්‍රධාන විෂයයන් 3ම සමත් වීම වේ.

13. අයදුම්කරුවන් තෝරාගනු ලබන්නේ අදාළ විෂය දැනුම සහ පාඨමාලාව පැවැත්වෙන භාෂා මාධ්‍යයෙන් සන්නිවේදනය කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම හා සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මතය. අයදුම්පත් වැඩි ප්‍රමාණයක් ඇති විට විද්‍යාලය විසින් ලිඛිත විභාගයකින් තෝරා ගැනීමට කටයුතු කරනු ඇත.

14. මෙම අයදුම්පත්‍රය සමඟ සුදුසුකම් වල සහතිකපත් හෝ සහතිකපත්‍ර වල ඡායාපිටපත් ඉදිරිපත් නොකළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී අවශ්‍ය හා පිළිගත හැකි ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතු අතර අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන ලිපි ලේඛනවල සත්‍යතාව පිළිබඳව සම්පූර්ණ වගකීම ඔහු හෝ ඇය විසින් දැරිය යුතු ය. වංචනික හෝ වෙනස් කිරීම් සහිත ලිපි ලේඛන ඉදිරිපත් කරන හෝ අයදුම්පතෙහි සඳහන් කරුණු සනාථ වන සේ ලිපි ලේඛන සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

15. තෝරාගනු ලබන පූර්ණ කාලීන පාඨමාලාවල සිසුන් සඳහා පහත දැක්වෙන ප්‍රතිලාභ හිමි වේ.

I. පූර්ණ කාලීන පාඨමාලාවන් සඳහා අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන්ට නිපුණතා සිසු සවිය යටතේ මාසිකව රු 7,500/- උපරිමයකට යටත්ව පැමිණීමේ දීමනාවක් හිමි වේ.

II. පූර්ණ කාලීන පාඨමාලා හදාරන සිසුන් සඳහා ලංගම හා දුම්රිය අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර අවශ්‍යතාව මත ලබා ගත හැකිය.

III. පාඨමාලා පැවැත්වීමට, අවශ්‍යතාවය පරිදි පුහුණු ද්‍රව්‍ය හා උපකරණ රජය විසින් නොමිලේ සපයනු ලැබේ.

16. තෝරාගත් පාඨමාලාවන් සඳහා විශේෂ අනුමැතිය මත අවශ්‍ය වුවහොත් මාර්ගගත ක්‍රමයට දේශන පැවැත්වෙනු ඇති අතර එය අධ්‍යයන කාලයට අදාළව දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර නීති රීති වලට එකඟව සිදු කරනු ලබයි.

17. කිසියම් විද්‍යාලයක පවත්වන පාඨමාලාවක් (පළමු/දෙවන/තෙවන) වසර සඳහා ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවල දී ලියාපදිංචි වී ඇති බහුතර සිසුන් සංඛ්‍යාව සිටින අදාල පාඨමාලාව සහිත ආසන්නතම විද්‍යාලය සමඟ ඒකාබද්ධ කිරීම හෝ එම පාඨමාලාව පැවැත්වෙන වෙනත් ආසන්නතම තාක්ෂණ/කාර්මික විද්‍යාලයකට යොමු කිරීම කරනු ලැබේ.

18. අර්ධ කාලීන පාඨමාලාවක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන්,

I. අදාළ ක්ෂේත්‍රයේ රැකියාවක නිරත වන බව තහවුරු කිරීම සඳහා පිළිගත් සේවා සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

II. එසේ නොවන්නේ නම් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක NVQ Circular :- 05/2022 ට අනුව අවසාන විභාගයට පෙර අදාළ ක්ෂේත්‍රයේ මාස 06 ක රැකියා පුහුණුවක් ලබා තිබිය යුතු ය. (මෙය අදාළ වන්නේ විශේෂයෙන්ම අදාළ ක්ෂේත්‍රයේ රැකියාවක නිරතවීම අවශ්‍ය නොවන පාඨමාලා සඳහා පමණි)

19. සිසුන් අවසන් විභාගය සහ ඇගයීම් සඳහා සුදුසුකම් ලැබීමට, දේශන හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා 75% සහභාගීවීම අනිවාර්ය වන අතර අවම වශයෙන් අඛණ්ඩ ඇගයීම්වල දී සාධන මට්ටම උපයාගෙන තිබීම අත්‍යවශ්‍ය වේ. එසේ නොවන අවස්ථාවල දී අවසන් විභාග හා ඇගයීම් සඳහා පෙනී සිටීමට අවස්ථාවක් හිමි නොවේ.

20. පාඨමාලා ක්ෂේත්‍රයන් BSC, ECC, ETC, ESC, MCC පාඨමාලා සඳහා මෙම දෙපාර්තමේන්තුව මගින් අවසන් විභාගයක් පවත්වා දෙපාර්තමේන්තු සහතිකයක් නිකුත් කරනු ලැබේ. NVQ 5/6 ඩිප්ලෝමා පාඨමාලා සඳහා සමාසික විභාග පවත්වා ඉන් සමත්වන සිසුන් NVQ අවසන් ඇගයීම් සඳහා යොමුකරනු ලැබේ.

21. දෙපාර්තමේන්තුව මඟින් අවසන් විභාග සඳහා ගාස්තු අය කරන ආකාරය පහත පරිදි වේ.

I. පළමු වරට පෙනී සිටින සිසුන්ගෙන් කිසිදු ගාස්තුවක් අය නොකෙරේ.

II. නැවත විභාගයට පෙනී සිටින(Repeat) සිසුන්ගෙන් හා නැවත ප්‍රතිඵල සමීක්ෂණය (Re-Correction) සිදු කරන සිසුන්ගෙන් එක් විෂයයකට NVQ Level 3/4 සඳහා රුපියල් දෙසියක මුදලක් ද NVQ Level 5/6 සඳහා රුපියල් තුන්සියයක මුදලක් ද අය කරනු ලැබේ.

22. මෙම *ගැසට් පත්‍රයෙහි* සඳහන් තාක්ෂණ විද්‍යාලවල සහ කාර්මික විද්‍යාලවල 2027 අධ්‍යයන වර්ෂයෙහි පැවැත්වීමට නියමිත පාඨමාලා සියල්ලම පැවැත්වීම හෝ කිහිපයක් පැවැත්වීම කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි වේ.

23. ගාස්තු අයකිරීමට යටත් කෙටි කාලීන (විශේෂ) පාඨමාලා විද්‍යාල විසින් හඳුන්වා දෙනු ලැබේ. ඔබට එම පාඨමාලා පිළිබඳ වැඩිදුර විස්තර ආසන්නයේ පිහිටි තාක්ෂණ විද්‍යාලයේ/ කාර්මික විද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයෙන් ලබා ගත හැක.

24. සිංහල, ඉංග්‍රීසි, දෙමළ ගැසට් පත්‍ර අතර වෙනසක් ඇතොත් සිංහල ගැසට් පත්‍රය බලාත්මක වේ.

ඩී.වත්සලා මාරඹගේ,
අධ්‍යක්ෂ ජනරාල්.

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 557,
ඕල්කොට් මාවත, කොළඹ 10.
www.dtet.gov.lk

තාක්ෂණ / කාර්මික විද්‍යාල ලැයිස්තුව

අනු. අංකය	*තාක්ෂණ / කාර්මික විද්‍යාලය*	*ලිපිනය*	*දුරකථන අංකය*	*දිස්ත්‍රික්කය*
01	අම්පාර හාඩි තාක්ෂණ විද්‍යාලය	ඉහිනියාගල පාර, අම්පාර.	063-2223485 063-2224236	අම්පාර
02	අනුරාධපුරය තාක්ෂණ විද්‍යාලය	විද්‍යාල මාවත, අනුරාධපුරය.	025-2222690 025-2224710	අනුරාධපුරය
03	බදුල්ල තාක්ෂණ විද්‍යාලය	ග්‍රීන්ලේන් ඩ්‍රයිව්, බදුලුපිටිය,බදුල්ල.	055-2222413 055-2230550 055-2220413	බදුල්ල
04	ගාල්ල තාක්ෂණ විද්‍යාලය	කළුවැල්ල, ගාල්ල.	091-2234051 091-2225985	ගාල්ල
05	යාපනය තාක්ෂණ විද්‍යාලය	බ්‍රවුන්ස් පාර, යාපනය.	021-2220028 021-2212403	යාපනය
06	මහනුවර තාක්ෂණ විද්‍යාලය	අරුප්පල, මහනුවර.	081-2224063 081-2211810	මහනුවර
07	කුරුණෑගල තාක්ෂණ විද්‍යාලය	පුත්තලම පාර, කුරුණෑගල.	037-2223264 037-2056069	කුරුණෑගල
08	ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලය මරදාන	ඕල්කොට් මාවත, කොළඹ 10.	011-2440352 011-2324177	කොළඹ
09	රත්නපුර තාක්ෂණ විද්‍යාලය	ෆාම් ගාර්ඩන්, කොළඹ පාර, රත්නපුරය.	045-2232390 045-2224715	රත්නපුර

අනු. අංකය	*තාක්ෂණ / කාර්මික විද්‍යාලය*	*ලිපිනය*	*දුරකථන අංකය*	*දිස්ත්‍රික්කය*
10	අක්කරෙයිපත්තුව කාර්මික විද්‍යාලය	ප්‍රධාන වීදිය, අක්කරෙයිපත්තුව.	067-2279326 067-2279865	අම්පාර
11	ආණමඩුව කාර්මික විද්‍යාලය	නවගත්තේගම පාර, ආණමඩුව.	032-2263288 032-2263299 032-2263163	පුත්තලම
12	බලපිටිය කාර්මික විද්‍යාලය	දුම්රියපොළ පාර, වඳදූව, බලපිටිය.	091-2258096 091-2255248	ගාල්ල
13	බණ්ඩාරවෙල කාර්මික විද්‍යාලය	වැවතැන්න, බණ්ඩාරවෙල.	057-2222753 057-2233754	බදුල්ල
14	මඩකලපුව කාර්මික විද්‍යාලය	ප්‍රධාන පාර, මන්චන්තොඩුවායි, මඩකලපුව.	065-2246557 065-2248366 065-2248727	මඩකලපුව
15	බෙලිඅත්ත කාර්මික විද්‍යාලය	පුවක්දණ්ඩාව, බෙලිඅත්ත.	047-2243229 047-2251255	හම්බන්තොට
16	දඹුල්ල කාර්මික විද්‍යාලය	මාතලේ පාර, දඹුල්ල.	066-2284713 066-2284885	මාතලේ
17	දෙහිඅත්තකණ්ඩිය කාර්මික විද්‍යාලය	මහවනාවෙල, දෙහිඅත්තකණ්ඩිය.	027-2250117 027-2250262	අම්පාර
18	ඇඹිලිපිටිය කාර්මික විද්‍යාලය	නෝනාගම පාර, ඇඹිලිපිටිය.	047-2261037 047-2261608	රත්නපුර
19	ගම්පහ කාර්මික විද්‍යාලය	වැරැල්ලවත්ත, යක්කල.	033-2229711 033-2222132 033-2233253	ගම්පහ
20	හසලක කාර්මික විද්‍යාලය	යෝධ ඇල පාර, හසලක.	055-2257129 055-2258950	මහනුවර
21	හෝමාගම කාර්මික විද්‍යාලය	ගොඩගම, හෝමාගම.	011-2855315 011-2857133	කොළඹ
22	කළුතර කාර්මික විද්‍යාලය	කලමුල්ල, කළුතර.	034-2227804 034-2222325 034-2236622	කළුතර

අනු. අංකය	*තාක්ෂණ / කාර්මික විද්‍යාලය*	*ලිපිනය*	*දුරකථන අංකය*	*දිස්ත්‍රික්කය*
23	කෑගල්ල කාර්මික විද්‍යාලය	කච්චේරි පාර, කෑගල්ල.	035-2222441 035-2223319	කෑගල්ල
24	කුලියාපිටිය කාර්මික විද්‍යාලය	පන්නල පාර, කුලියාපිටිය.	037-2281181 037-2281323 037-2281271	කුරුණෑගල
25	මන්නාරම කාර්මික විද්‍යාලය	පන්නායිවෙඩ්ඩුවන් හන්දිය, මඩුපාර.	023-3238532	මන්නාරම
26	මාතලේ කාර්මික විද්‍යාලය	එම්.සී. පාර, මාතලේ.	066-2224196 066-2224847	මාතලේ
27	මාතර කාර්මික විද්‍යාලය	මැද්දවත්ත, මාතර.	041-2222565	මාතර
28	මැදගම කාර්මික විද්‍යාලය	බිබිලේ පාර, මැදගම.	055-2266113 055-2266213	මොණරාගල
29	මොණරාගල කාර්මික විද්‍යාලය	සිරිගල, මොණරාගල.	055-2276167 055-2277448	මොණරාගල
30	නුවරඑළිය කාර්මික විද්‍යාලය	ජයතිලක මාවත, නුවරඑළිය.	052-2222658 052-2235895	නුවරඑළිය
31	පාතදුම්බර කාර්මික විද්‍යාලය	නවයාලතැන්න, කටුගස්තොට.	081-2499782 081-2499024 081-2500441	මහනුවර
32	පොළොන්නරුව කාර්මික විද්‍යාලය	විද්‍යාපුර, පොළොන්නරුව.	027-2224429 027-2224428	පොළොන්නරුව
33	රත්මලාන කාර්මික විද්‍යාලය	ගාලුපාර, රත්මලාන.	011-2632778 011-2626955	කොළඹ
34	සම්මන්තුරේ කාර්මික විද්‍යාලය	අම්පාර පාර, සම්මන්තුරේ.	067-2260933 067-2051105 067-3133673	අම්පාර
35	ත්‍රිකුණාමලය කාර්මික විද්‍යාලය	මිහිඳුපුර, ත්‍රිකුණාමලය.	026-2223034 026-2051513 026-2227956	ත්‍රිකුණාමලය
36	වවුනියාව කාර්මික විද්‍යාලය	මන්නාරම පාර, නෙලුක්කුලම්, වවුනියාව.	024-2223664 024-2226720	වවුනියාව

අනු. අංකය	*තාක්ෂණ / කාර්මික විද්‍යාලය*	*ලිපිනය*	*දුරකථන අංකය*	*දිස්ත්‍රික්කය*
37	වරකාපොල කාර්මික විද්‍යාලය	අහුරුවැල්ල පාර, වරකාපොල.	035-2267651 035-2268302	කෑගල්ල
38	වාරියපොල කාර්මික විද්‍යාලය	හලාවත පාර, වාරියපොල.	037-2267256	කුරුණෑගල
39	වීරවිල කාර්මික විද්‍යාලය	නව නගරය, වීරවිල.	047-2237064 047-2237032	හම්බන්තොට

ආදර්ශ අයදුම්පත්‍රය

තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාලවලට ඇතුළත්වීම සඳහා අයදුම්පත්‍රය - 2027 අධ්‍යයන වර්ෂය

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

වැදගත්: (අයදුම්පත්‍රය අදාළ තාක්ෂණ / කාර්මික විද්‍යාලයේ අධ්‍යක්ෂ / විදුහල්පති වෙතට යැවිය යුතුය. තාක්ෂණ / කාර්මික විද්‍යාලවල ලිපිනයන් තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල ලැයිස්තුවේ දක්වා ඇත.)

1. තාක්ෂණ විද්‍යාලයේ / කාර්මික විද්‍යාලයේ නම :

2. ඉල්ලුම් කරන පාඨමාලාව :

   2.1 පාඨමාලා කේතය :

   2.2 පාඨමාලාවේ නම :

3. ජාතික හැඳුනුම්පත් අංකය :

4. භාෂා මාධ්‍යය: - සිංහල ☐ දෙමළ ☐ ඉංග්‍රීසි ☐

5. අයදුම්කරුගේ මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

6. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :-

7. මුලකුරු සමග නම (සිංහල / දෙමළ) :- .....
.....

8. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :-

9. ස්ථිර ලිපිනය (සිංහල / දෙමළ) :-

.....
.....

10. උපන් දිනය: - | | | | | | | | | 2026.12.04 දිනට වයස : අවුරුදු : | | මාස : | | දින : | |

11. ස්ත්‍රී/ පුරුෂ භාවය : පුරුෂ | | ස්ත්‍රී | |

12. අයදුම්කරුගේ පදිංචිය පිළිබඳ තොරතුරු :

පළාත :- | | දිස්ත්‍රික්කය :- | |

ග්‍රාම නිලධාරී කොට්ඨාශය :- | | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය:- | |

13. දුරකථන අංකය: - නිවස (දෙමාපිය හෝ භාරකරු): | | | | | | | | |

ජංගම: | | | | | | | | |

14. NVQ සුදුසුකම් මත පාඨමාලාවලට ඇතුළත්වීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් සඳහා පමණි

ලබා ඇති NVQ සහතිකයේ නම (වෘත්තීය ක්ෂේත්‍රයද සමග)	*NVQ මට්ටම*	*පාඨමාලාව හැදෑරූ ආයතනයේ නම*	*අදාළ සේවා පළපුරුද්ද ඇත්නම් ඒ පිළිබඳ විස්තර කෙටියෙන්*	*හැදෑරූ පාඨමාලා කාලය අවුරුදු / මාස*

15. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අ.පොෙ.ස. (සා.පෙළ) ප්‍රතිඵල (දෙවරකට නොවැඩි වාර ගණනක දී)

පළමු වර : විභාග අංකය: .....
වර්ෂය ..... මාධ්‍යය .....

	විෂයය	*සාමාර්ථය*
1		
2		
3		
4		
5		
6		
7		
8		
9		
10		

දෙවන වර : විභාග අංකය: .....
වර්ෂය ..... මාධ්‍යය .....

	විෂයය	*සාමාර්ථය*
1		
2		
3		
4		
5		
6		
7		
8		
9		
10		

174.	ETC 11.1	ජාතික තාක්ෂණ සහතිකය - (සිවිල් ඉංජිනේරු) NCT (Civil Engineering) අර්ධ කාලීන අවුරුදු 03 ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව I හා II වසර ඉදිකිරීම් තාක්ෂණ ඩිප්ලෝමාවේ විෂයමාලාව ආවරණ කෙරෙන අතර, III වසර පෙර පරිදිම NCT(සිවිල් ඉංජිනේරු) විෂයමාලාවේ අවසන් වසර සම්පූර්ණ කර, සිසුන්ගේ විභාග ප්‍රතිඵල මත NCT සහතිකය මෙම දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලැබේ.	1. අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 3 / 4 සහතිකය ලබා තිබීම. (NVQ 3 සුදුසුකමෙන් ලියාපදිංචි වන සිසුන් දෙවන සමාසිකයේ අවසන් විභාගයට පෙර අදාළ ක්ෂේත්‍රයේ NVQ 4 සුදුසුකම ලබා ගත යුතු ය); *හෝ* දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් භාෂා මාධ්‍යය (සිංහල / දෙමළ / ඉංග්‍රීසි) , ගණිතය, විද්‍යාව සහ වෙනත් විෂයන් තුනක් ඇතුලුව විෂයයන් හයකින්(06) සමත් වී තිබීම, සහ මෙම සුදුසුකම් මත බඳවාගනු ලබන සිසුන් පාඨමාලාවේ දෙවන වසර අවසන් වීමට පෙර අදාළ විෂයය ක්ෂේත්‍රයෙන් NVQ 4 සුදුසුකම් ලබාගැනීම අනිවාර්යය වේ. *හෝ* අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් විෂයයන් තුනකින්(03) එකවර සමත්වීම (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර) 2. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද තිබීම.	<u>ඉංග්‍රීසි මාධ්‍යය</u> <u>NVQ මට්ටම් 5</u> යාපනය, මරදාන, අක්කරෙයිපත්තු, සම්මන්තුරේ, අනුරාධපුරය, අම්පාර, මහනුවර, කුරුණෑගල, මඩකලපුව, බෙලිඅත්ත, දඹුල්ල, කළුතර, කෑගල්ල, මොණරාගල, රත්මලාන, ත්‍රිකුණාමලය, බලපිටිය, ඇඹිලිපිටිය, - බණ්ඩාරවෙල, හෝමාගම, මාතර
175.	F45T001P6.0	ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව Higher National Diploma in Construction Technology. අර්ධ කාලීන, අවුරුදු 01 ½	1. අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 5 සහතික ලබා තිබීම. 2. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද තිබීම.	<u>ඉංග්‍රීසි මාධ්‍යය</u> <u>NVQ මට්ටම් 6</u> කුරුණෑගල යාපනය,මහනුවර, බදුල්ල, අනුරාධපුරය, මඩකලපුව, ඇඹිලිපිටිය, ගම්පහ, මන්නාරම, රත්මලාන, වවුනියාව

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
176.	F45T001P5.0	ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව National Diploma in Construction Technology අර්ධ කාලීන, අවුරුදු 01 ½	1.අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 4 සහතික ලබා තිබීම; *හෝ* අ.පොස (උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය /ගණිතය /විද්‍යාව යන විෂය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් 03 ක් එකවර සමත් වී තිබීම (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර) *හෝ* අ.පොස.(උ.පෙළ) කලා විෂය ධාරාවේ දෘඩ තාක්ෂණය (Hard Technology) යටතේ වූ විදුලි තාක්ෂණය (Electrical Technology), විද්‍යුත් තාක්ෂණය (Electronic Technology), සිවිල් තාක්ෂණ (Civil Technology) යන විෂයන් අතුරින් එක් විෂයක් සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව විෂයන් තුනක් සමත් වී තිබීම (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර) 2. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද තිබීම.	ඉංග්‍රීසි මාධ්‍යය NVQ මට්ටම් 5 අම්පාර සම්මන්තුරේ බදුල්ල ඇඹිලිපිටිය ගම්පහ කළුතර මහනුවර රත්නපුර හෝමාගම කෑගල්ල රත්මලාන වවුනියාව
177.	F45T002P6.1	ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව Higher National Diploma in Quantity Surveying Technology අර්ධ කාලීන, අවුරුදු 01 ½	1.අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 5 සහතික ලබා තිබීම. 2. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද තිබීම.	ඉංග්‍රීසි මාධ්‍යය NVQ මට්ටම් 6 යාපනය මඩකලපුව රත්මලාන

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
178.	F45T002P5.1	ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව National Diploma in Quantity Surveying Technology අර්ධකාලීන, අවුරුදු 01 ½	1. අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 4 සහතික ලබා තිබීම; *හෝ* අ.පො.ස. (උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය / ගණිතය/විද්‍යාව යන විෂය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයන් තුනක් එකවර සමත් වී තිබීම (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර); *හෝ* අ.පො.ස. (උ.පෙළ) කලා විෂය ධාරාවේ දෘඩ තාක්ෂණය (Hard Technology) යටතේ වූ සිවිල් තාක්ෂණය (Civil Technology) විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයන් තුනක් (03) සමත් වී තිබීම(GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර) 2. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද තිබීම.	<u>ඉංග්‍රීසි මාධ්‍යය</u> <u>NVQ මට්ටම් 5</u> බදුල්ල ගම්පහ රත්මලාන මහනුවර කෑගල්ල
179.	F45T003BLP5.1	සැලසුම් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (ගොඩනැගිලි) National Diploma in Drafting Technology (Building) අර්ධ කාලීන, අවුරුදු 01 ½	1.අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 4 සහතික ලබා තිබීම; *හෝ* අ.පො.ස. (උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය / ගණිතය / විද්‍යාව යන විෂය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයන් තුනක් එකවර සමත් වී තිබීම (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර) *හෝ* අ.පො.ස.(උ.පෙළ) කලා විෂය ධාරාවේ දෘඩ තාක්ෂණය (Hard Technology) යටතේ වූ සිවිල් තාක්ෂණය (Civil Technology) විෂය සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව විෂයන් තුනක් සමත්වී තිබීම (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර). 2. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද තිබීම.	<u>ඉංග්‍රීසි මාධ්‍යය</u> <u>NVQ මට්ටම් 5</u> රත්මලාන වව්නියාව යාපනය බදුල්ල අනුරාධපුරය මරදාන රත්නපුර මාතර

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන නාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
180.	ETC 22.1	ජාතික තාක්ෂණ සහතිකය- (ප්‍රමාණ සමීක්ෂණ) NCT (Quantity Surveying) අර්ධ කාලීන, අවුරුදු 03 ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව I හා II වසර ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවේ විෂයමාලාව ආවරණ කෙරෙන අතර, III වසර පෙර පරිදිම NCT (සිවිල් ඉංජිනේරු) විෂයමාලාවේ අවසන් වසර සම්පූර්ණ කර, සිසුන්ගේ විභාග ප්‍රතිඵල මත NCT සහතිකය මෙම දෙපාර්තමේන්තුව මගින් නිතුත් කරනු ලැබේ.	1. දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් භාෂා මාධ්‍යය (සිංහල / දෙමළ / ඉංග්‍රීසි), ගණිතය, විද්‍යාව සහ වෙනත් විෂයන් තුනක් ඇතුලුව විෂයයන් හයකින්(06) සමත් වී තිබීම, සහ මෙම සුදුසුකම් මත බඳවාගනු ලබන සිසුන් පාඨමාලාවේ දෙවන වසර අවසන් වීමට පෙර අදාළ විෂයය ක්ෂේත්‍රයෙන් NVQ 4 සුදුසුකම් ලබාගැනීම අනිවාර්යය වේ. *හෝ* අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් විෂයයන් තුනකින්(03) එකවර සමත්වීම (GIT,සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර); *හෝ* අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 3/4 සුදුසුකම ලබා තිබීම.(NVQ 3 සුදුසුකමෙන් ලියාපදිංචි වන සිසුන් දෙවන සමාසිකයේ අවසන් විභාගයට පෙර අදාළ ක්ෂේත්‍රයේ NVQ 4 සුදුසුකම ලබා ගත යුතු ය) 2. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද තිබීම.	<u>ඉංග්‍රීසි මාධ්‍යය</u> <u>NVQ මට්ටම් 5</u> යාපනය කෑගල්ල මරදාන බෙලිඅත්ත මාතර රත්මලාන

මෝටර්රථ අළුත්වැඩියා හා නඩත්තු ක්ෂේත්‍රය
පූර්ණ කාලීන පාඨමාලා

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන නාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
181.	G50T001F5.1	මෝටර්රථ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව National Diploma in Automobile Technology	1.අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 4 සහතික ලබා තිබීම; *හෝ*	<u>**ඉංග්‍රීසි මාධ්‍යය**</u> <u>NVQ මට්ටම් 5</u> අම්පාර මහනුවර

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
181.	G50T001F5.1	පූර්ණ කාලීන, අවුරුදු 01 ½ (පදනම් පාඨමාලාවක් ඇතුළත්ය.) රැකියාගත පුහුණුව මාස 06 කි.	අ.පො.ස.(උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය / ගණිතය / විද්‍යාව යන විෂය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් එකවර සමත් වී තිබීම.(GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර); *හෝ* අ.පො.ස.(උ.පෙළ) කලා විෂය ධාරාවේ දෘඩ තාක්ෂණය (Hard Technology) යටතේ වූ යාන්ත්‍රික තාක්ෂණය (Mechanical Technology) විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් තුනක්(03) සමත් වී තිබීම. (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර)	කුරුණෑගල මරදාන ගම්පහ සම්මන්තුරේ මාතර
182.	A01T001F5.1	ගොවි යන්ත්‍රෝපකරණ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව National Diploma in Farm Machinery Technology පූර්ණ කාලීන, අවුරුදු 01 ½ (පදනම් පාඨමාලාවක් ඇතුළත්ය) රැකියාගත පුහුණුව මාස 06 කි.	1. අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 4 සහතික ලබා තිබීම; හෝ අ.පො.ස.(උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය / ගණිතය / විද්‍යාව යන විෂය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් එකවර සමත් වී තිබීම (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර). උසස් පෙළ ඉංජිනේරු තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ. *හෝ* අ.පො.ස.(උ.පෙළ) කලා විෂය ධාරාවේ මෘදු තාක්ෂණය (Soft Technology) යටතේ වූ කෘෂි තාක්ෂණය - (Agro Technology) හෝ දෘඩ තාක්ෂණය(Hard Technology) යටතේ වූ යාන්ත්‍රික තාක්ෂණය (Mechanical Technology) යන විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සමාර්ථයක් සහිතව විෂයයන් තුනක් එකවර (03) සමත් වී තිබීම(GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර).	<u>**ඉංග්‍රීසි මාධ්‍යය**</u> <u>NVQ මට්ටම් 5</u> අනුරාධපුරය

මෝටර් රථ අළුත්වැඩියා හා නඩත්තු ක්ෂේත්‍රය
අර්ධ කාලීන පාඨමාලා

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
183.	G50T001P6.1	මෝටර් රථ තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව Higher National Diploma in Automobile Technology අර්ධ කාලීන, අවුරුදු 01 ½	1.අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 5 සහතික ලබා තිබීම. 2. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද තිබීම.	**<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>** **<u>NVQ මට්ටම් 6</u>** කුරුණෑගල මරදාන
184.	G50T001P5.1	මෝටර් රථ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව National Diploma in Automobile Technology අර්ධ කාලීන, අවුරුදු 01½	1.අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 4 සහතික ලබා තිබීම; *හෝ* අ.පො.ස.(උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය / ගණිතය / විද්‍යාව යන විෂය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් එකවර සමත් වී තිබීම(GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර); *හෝ* අ.පො.ස.(උ.පෙළ) කලා විෂය ධාරාවේ දෘඩ තාක්ෂණය (Hard Technology) යටතේ වූ යාන්ත්‍රික තාක්ෂණය (Mechanical Technology) විෂය සඳහා සම්මාන සමාර්ථයක් සහිතව විෂයයන් තුනක් එකවර සමත් වී තිබීම (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර). 2. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද තිබීම.	**<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>** **<u>NVQ මට්ටම් 5</u>** මහනුවර කුරුණෑගල බදුල්ල බණ්ඩාරවෙල ගම්පහ කෑගල්ල

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
185.	ETC 23.1	ජාතික තාක්ෂණ සහතිකය - යාන්ත්‍රික ඉංජිනේරු (මෝටර් රථ තාක්ෂණය) National Certificate in Technology (Mechanical Engineering - Automobile Technology) අර්ධ කාලීන, අවුරුදු 03 මෝටර් රථ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව I හා II වසර මෝටර් රථ තාක්ෂණ විෂයමාලාව ආවරණය කෙරෙන අතර, III වසර පෙර පරිදිම NCT (යාන්ත්‍රික ඉංජිනේරු) විෂය මාලාවේ අවසන් වසර සම්පූර්ණ කර, සිසුන්ගේ විභාග ප්‍රතිඵල මත NCT සහතිකය මෙම දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලැබේ.	1.දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් භාෂා මාධ්‍යය (සිංහල / දෙමළ / ඉංග්‍රීසි), ගණිතය, විද්‍යාව සහ වෙනත් විෂයයන් තුනක් ඇතුලුව විෂයයන් හයකින්(06) සමත් වී තිබීම, සහ මෙම සුදුසුකම් මත බඳවාගනු ලබන සිසුන් පාඨමාලාවේ දෙවන වසර අවසන් වීමට පෙර අදාළ විෂය ක්ෂේත්‍රයෙන් NVQ 4 සුදුසුකම් ලබාගැනීම අනිවාර්යය වේ. *හෝ* අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් විෂයයන් තුනකින්(03) එකවර සමත්වීම (GIT,සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර); *හෝ* අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 3 / 4 සුදුසුකම ලබා තිබීම.(NVQ 3 සුදුසුකමෙන් ලියාපදිංචි වන සිසුන් දෙවන සමාසිකයේ අවසන් විභාගයට පෙර අදාළ ක්ෂේත්‍රයේ NVQ 4 සුදුසුකම ලබා ගත යුතු ය.) 2. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද තිබීම.	**<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>** **<u>NVQ මට්ටම් 5</u>** මරදාන යාපනය අනුරාධපුරය බණ්ඩාරවෙල මාතර

ශීතකරණ හා වායුසමන
පූර්ණ කාලීන පාඨමාලා

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
186.	G52T001F5.0	ශීතකරණ හා වායුසමන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව	1.අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 4 සහතික ලබා තිබීම; *හෝ*	**<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>** <u>NVQ මට්ටම් 5</u> රත්නපුර අනුරාධපුරය

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
186.	G52T001F5.0	National Diploma in Refrigeration & Air Conditioning Technology පූර්ණ කාලීන, අවුරුදු 01 ½ (පදනම් පාඨමාලාවක් ඇතුළත්ය.) රැකියාගත පුහුණුව මාස 06 කි.	අ.පොස.(උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය / ගණිතය / විද්‍යාව යන විෂය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයන් තුනක් එකවර සමත් වී තිබීම. (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර) *හෝ* අ.පොස. (උ.පෙළ) කලා විෂය ධාරාවේ දෘඩ තාක්ෂණය (Hard Technology) යටතේ වූ විදුලි තාක්ෂණය (Electrical Technology),විද්‍යුත් තාක්ෂණය (Electronic Technology) යන විෂයයන් අතුරින් එක් විෂයක් සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් තුනක් එකවර සමත් වී තිබීම (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර).	ගම්පහ මහනුවර ගාල්ල බණ්ඩාරවෙල මඩකලපුව සම්මන්තුරේ

ශීතකරණ හා වායුසමන
අර්ධ කාලීන පාඨමාලා

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
187.	G52T001P5.0	ශීතකරණ හා වායුසමන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව National Diploma in Refrigeration & Air Conditioning Technology අර්ධ කාලීන, අවුරුදු 01 ½	1.අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 4 සහතික ලබා තිබීම ; *හෝ* අ.පොස. (උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය / ගණිතය / විද්‍යාව යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් එකවර සමත් වී තිබීම (GIT,සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර); *හෝ* අ.පොස. (උ.පෙළ) කලා විෂය ධාරාවේ දෘඩ තාක්ෂණය (Hard Technology) යටතේ වූ විදුලි තාක්ෂණය (Electrical Technology),විද්‍යුත් තාක්ෂණය (Electronic Technology) යන	**<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>** **<u>NVQ මට්ටම් 5</u>** ගම්පහ ගාල්ල

අනු. අංකය	*පාඨමාලා ක්ෂේත්‍රය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
187.	G52T001P5.0		විෂයන් අතුරින් එක් විෂයක් සඳහා සම්මාන සමාර්ථයක් සහිතව විෂයයන් තුනක් එකවර සමත් වී තිබීම(GIT,සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර). 2. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද තිබීම.	

කෘෂිකාර්මික වගාවන් හා පශු සම්පත් ක්ෂේත්‍රය
පූර්ණ කාලීන පාඨමාලා

අනු. අංකය	*පාඨමාලා ක්ෂේත්‍රය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
188.	A01T005F5.0	පසු අස්වනු තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව National Diploma in Post-harvest Technology පූර්ණ කාලීන, අවුරුදු 01 ½ (පදනම් පාඨමාලාවක් ඇතුළත්ය.) රැකියාගත පුහුණුව මාස 06 කි.	1. අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 4 සහතික ලබා තිබීම; *හෝ* අ.පොස (සා.පෙළ) විභාගයේ කෘෂිකර්මය ඇතුළු විෂයයන් හයකින් (06) එක්වරකදී සමත් වී තිබීම, සහ පහත සඳහන් විෂයයන්ගෙන් හතරක් (04) සඳහා සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතුය. පළමු භාෂාව,ගණිතය,විද්‍යාව සහ සමාජ අධ්‍යයන ; *හෝ* කෘෂිකර්මය, උද්‍යාන විද්‍යාව, සත්ත්ව පාලනය,ආහාර තාක්ෂණය, මිරිදිය ජීව සම්පත් තාක්ෂණය, සමුද්‍ර ජීව සම්පත් තාක්ෂණය යන විෂයයන්ගෙන් එකක් ; *සමග* අ.පොස (උ.පෙළ) ජීවවිද්‍යාව / ගණිතය විෂය ධාරාවෙන් උසස්පෙළ හදාරා තිබීම; *හෝ* අ.පොස (උ.පෙළ) තාක්ෂණවේදය / විද්‍යාව යන විෂය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් (03) සමත් වී	**<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>** **<u>NVQ මට්ටම් 5</u>** අනුරාධපුරය

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
188.	A01T005F5.0		තිබීම (GIT,සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර). (උසස් පෙළ තාක්ෂණවේදය විෂය ධාරාවේ කෘෂිකර්මය විෂය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ. *හෝ* අ.පො.ස (උ.පෙළ) කලා විෂය ධාරාවේ මෘදු තාක්ෂණය (Soft Technology) යටතේ වූ කෘෂි තාක්ෂණය (Agro Technology) හෝ දෘඩ තාක්ෂණය (Hard Technology) යටතේ වූ යාන්ත්‍රික තාක්ෂණය (Mechanical Technology) යන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් තුනක් (03) එකවර සමත් වී තිබීම. (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර);	
189.	A01T003F7.1	කෘෂි නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව Higher National Diploma in Agricultural Production Technology (NVQ මට්ටම් 5 සහ 6 ඒකාබද්ධව පවතී) පූර්ණ කාලීන අවුරුදු 02	1. අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 4 සහතික ලබා තිබීම; *හෝ* අ.පො.ස.(උ.පෙළ) ජෛව තාක්ෂණවේදය/ භෞතික විද්‍යාව /ජීව විද්‍යාව යන විෂය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් (03) එක් වරකදී සමත් වී තිබීම (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර); *හෝ* අ.පො.ස උ/පෙළ කලා විෂයධාරාවෙන් කෘෂිකර්මය විෂය ඇතුළුව විෂයයන් තුනක් සමත්වී තිබීම (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර).	**<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>** **<u>NVQ මට්ටම් 6</u>** දඹුල්ල කුලියාපිටිය අම්පාර හසලක වරකාපොල සම්මන්තුරේ ඇඹිලිපිටිය මහනුවර බණ්ඩාරවෙල හෝමාගම

කෘෂිකාර්මික වගාවන් හා පශු සම්පත් ක්ෂේත්‍රය
අර්ධ කාලීන පාඨමාලා

අනු. අංකය	පාඨමාලා කේතය	පාඨමාලාවේ නම හා ස්වභාවය	ඇතුළත්වීමේ සුදුසුකම්	පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල
190.	A01T003P6.1	කෘෂි නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව Higher National Diploma in Agricultural Production Technology අර්ධ කාලීන, අවුරුදු 01 ½	1. අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම 5 සහතිකයක් ලබා තිබීම. 2. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද තිබීම.	**<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>** **<u>NVQ මට්ටම් 6</u>** මහනුවර වරකාපොල ඇඹිලිපිටිය සම්මන්තුරේ

අනු. අංකය	පාඨමාලා ක්ෂේත්‍රය	පාඨමාලාවේ නම හා ස්වභාවය	ඇතුළත්වීමේ සුදුසුකම්	පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල
191.	A01T003P5.1	කෘෂි නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව National Diploma in Agricultural Production Technology අර්ධ කාලීන, අවුරුදු 01 ½	1. අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 4 සහතික ලබා තිබීම; *හෝ* අ.පොස. (උ.පෙළ) ජෛව තාක්ෂණවේදය/ භෞතික විද්‍යාව /ජීව විද්‍යාව යන විෂය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් (03) එක් වරකදී සමත් වී තිබීම (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර); *හෝ* අ.පොස උ/පෙළ කලා විෂයධාරාවෙන් කෘෂිකර්මය විෂය ඇතුළුව විෂයයන් තුනක් සමත්වී තිබීම. (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර) 2. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද තිබීම.	**<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>** **<u>NVQ මට්ටම් 5</u>** මොණරාගල වරකාපොල ඇඹිලිපිටිය අම්පාර සම්මන්තුරේ වීරවිල මහනුවර ආණමඩුව

තොරතුරු සන්නිවේදන හා බහුමාධ්‍යය තාක්ෂණ ක්ෂේත්‍රය
පූර්ණ කාලීන පාඨමාලා

අනු. අංකය	*පාඨමාලා ක්ෂේත්‍රය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
192.	K72T001F5.2	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව National Diploma in Information & Communication Technology පූර්ණ කාලීන, අවුරුදු 01 ½ (පදනම් පාඨමාලාවක් ඇතුළත්ය.) රැකියාගත පුහුණුව මාස 06 කි.	1.අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 4 සහතික ලබා තිබීම; *හෝ* තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) විෂය ඇතුළුව අ.පොස (උ.පෙළ) විෂයයන් තුනක් එකවර සමත් වී තිබීම (GIT,සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර); හෝ තාක්ෂණවේදය/ භෞතික විද්‍යාව / ජීව විද්‍යාව අංශයෙන් අ.පොස (උ.පෙළ) විෂයයන් තුනක් සමත් වී තිබීම(GIT,සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර).	**<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>** **<u>NVQ මට්ටම් 5</u>** අම්පාර, බදුල්ල, ගාල්ල මරදාන, රත්නපුර වවුනියාව, යාපනය, නුවරඑළිය, කෑගල්ල, මහනුවර, කුරුණෑගල, මාතර, සම්මන්තුරේ, රත්මලාන

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
193.	K72T002F5.0	තොරතුරු සහ සයිබර් ආරක්ෂණ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව National Diploma in Information and Cyber Security Technology පූර්ණ කාලීන අවුරුදු 01 ½ (පදනම් පාඨමාලාවක් ඇතුළත්ය.) රැකියාගත පුහුණුව මාස 06 කි.	1. අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 4 සහතික ලබා තිබීම; *හෝ* අ.පො.ස.(උ.පෙළ) විභාගයේ ඕනෑම විෂය ධාරාවකින් විෂයයන් 3 ක් සමත් වී තිබීම (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර).	**ඉංග්‍රීසි මාධ්‍යය** **NVQ මට්ටම් 5** යාපනය
194.	K72T004F5.0	පූර්ණ මෘදුකාංග සංවර්ධනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව National Diploma in Full Stack Software Development පූර්ණ කාලීන අවුරුදු 01 ½ (පදනම් පාඨමාලාවක් ඇතුළත්ය.) රැකියාගත පුහුණුව මාස 06 කි.	1.අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 4 සහතික ලබා තිබීම; *හෝ* තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) විෂය ඇතුළුව අ.පො.ස (උ.පෙළ) විෂයයන් තුනක් එකවර සමත් වී තිබීම (GIT,සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර); *හෝ* තාක්ෂණවේදය/ භෞතික විද්‍යාව / ජීව විද්‍යාව අංශයෙන් අ.පො.ස (උ.පෙළ) විෂයයන් තුනක් සමත් වී තිබීම(GIT,සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර).	**ඉංග්‍රීසි මාධ්‍යය** **NVQ මට්ටම් 5** ගාල්ල

තොරතුරු සන්නිවේදන හා බහුමාධ්‍යය තාක්ෂණ ක්ෂේත්‍රය
අර්ධ කාලීන පාඨමාලා

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
195.	K72T001PS6.2	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (Software Development with Data Science)	1. අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 5 සුදුසුකම ලබා තිබීම 2. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද තිබීම.	**ඉංග්‍රීසි මාධ්‍යය** **NVQ මට්ටම් 6** යාපනය

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
195.	K72T001PS6.2	Higher National Diploma in Information & Communication Technology (Software Development with Data Science) අර්ධ කාලීන, අවුරුදු 01 ½		
196.	K72T001PN6.2	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (Networking, Cloud computing & Cyber Security) Higher National Diploma in Information & Communication Technology (Networking, Cloud Computing & Cyber Security) අර්ධ කාලීන, අවුරුදු 01 ½	1. අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 5 සහතිකය ලබා තිබීම 2. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද තිබීම.	<u>ඉංග්‍රීසි මාධ්‍යය</u> <u>NVQ මට්ටම් 6</u> බදුල්ල
197.	K72T002P6.0	තොරතුරු සහ සයිබර් ආරක්ෂණ තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව Higher National Diploma in Information and Cyber Security Technology අර්ධ කාලීන අවුරුදු 01 ½	1. අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 5 සහතිකය ලබා තිබීම 2. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද තිබීම.	<u>ඉංග්‍රීසි මාධ්‍යය</u> <u>NVQ මට්ටම් 6</u> ගම්පහ
198.	K72T001P5.2	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව National Diploma in Information & Communication Technology අර්ධ කාලීන අවුරුදු 01 ½	1.අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 4 සහතික ලබා තිබීම; *හෝ* තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) විෂයය අතුළුව අ.පො.ස (උ.පෙළ) විෂයයන් තුනක් සමත් වී තිබීම(GIT,සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර); *හෝ* තාක්ෂණවේදය/ භෞතික විද්‍යාව / ජීව විද්‍යාව අංශයෙන් අ.පො.ස (උ.පෙළ) විෂයයන් තුනක් සමත් වී තිබීම(GIT,සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර). 2. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද තිබීම.	<u>ඉංග්‍රීසි මාධ්‍යය</u> <u>NVQ මට්ටම් 5</u> මරදාන, යාපනය, අනුරාධපුරය, බදුල්ල, මහනුවර, රත්නපුර, ඇඹිලිපිටිය, කළුතර, මඩකලපුව, ගම්පහ, මොණරාගල, රත්මලාන, සම්මන්තුරේ, ගාල්ල, අක්කරේපත්තු, අම්පාර

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
199.	K72T002P5.0	තොරතුරු සහ සයිබර් ආරක්ෂණ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව National Diploma in Information and Cyber Security Technology අර්ධ කාලීන අවුරුදු 01 ½	1.අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 4 සහතික ලබා තිබීම; *හෝ* අ.පොස. (උ.පෙළ) විභාගයේ ඕනෑම විෂය ධාරාවකින් විෂයයන් 3 ක් සමත් වී තිබීම (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර). 2. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද තිබීම.	**<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>** **<u>NVQ මට්ටම් 5</u>** ගම්පහ යාපනය

ලෝහ හා මෘදුලෝහ ඉංජිනේරු ක්ෂේත්‍රය
පූර්ණ කාලීන පාඨමාලා

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
200.	D28T001F5.1	පෑස්සුම් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව National Diploma in Welding Technology පූර්ණ කාලීන, අවුරුදු 01 ½ (පදනම් පාඨමාලාවක් ඇතුළත්ය) රැකියාගත පුහුණුව මාස 06 කි.	1. අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 3 හෝ 4 සහතික ලබා තිබීම; *හෝ* අ.පොස.(උ.පෙළ) විභාගයේ ඕනෑම විෂය ධාරාවකින් විෂයයන් 3 ක් සමත් වී තිබීම (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර). (උසස්පෙළ තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.)	**<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>** <u>NVQ මට්ටම් 5</u> මරදාන
201.	D29T001F5.0	නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව National Diploma in Production Technology පූර්ණ කාලීන, අවුරුදු 01 ½ (පදනම් පාඨමාලාවක් ඇතුළත්ය.) රැකියාගත පුහුණුව මාස 06 කි.	1.අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 4 සහතික ලබා තිබීම; *හෝ* අ.පොස.(උ.පෙළ) විභාගයේ ඕනෑම විෂයධාරාවකින් විෂයයන් 3 ක් සමත් වී තිබීම (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර).	**<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>** <u>NVQ මට්ටම් 5</u> මහනුවර මරදාන ගාල්ල කුරුණෑගල

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
202.	D33T002F5.0	CNC තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව National Diploma in CNC Production Technology (Computer Numerical Control) පූර්ණ කාලීන, අවුරුදු 01 ½ (පදනම් පාඨමාලාවක් ඇතුළත්ය) රැකියාගත පුහුණුව මාස 06 කි.	1. අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 4 සහතික ලබා තිබීම; *හෝ* අ.පොෂ.ස. (උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය / ගණිතය / විද්‍යාව යන විෂය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් එකවර සමත් වී තිබීම(GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර); *හෝ* අ.පොෂ.ස.(උ.පෙළ) කලා විෂය ධාරාවේ දෘඩ තාක්ෂණය (Hard Technology) යටතේ වූ යාන්ත්‍රික තාක්ෂණය (Mechanical Technology) / තොරතුරු තාක්ෂණය (ICT) විෂය සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් තුනක් සමත් වී තිබීම. (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර)	**<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>** **<u>NVQ මට්ටම් 5</u>** ගම්පහ, මරදාන

ලෝහ හා මෘදු ලෝහ ඉංජිනේරු ක්ෂේත්‍රය
අර්ධ කාලීන පාඨමාලා

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
203.	D28T001P6.1	පෑස්සුම් තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව Higher National Diploma in Welding Technology අර්ධ කාලීන, අවුරුදු 01 ½	1.පෑස්සුම් තාක්ෂණය පිළිබඳ NVQ මට්ටම් 5 සහතිකය ලබා තිබීම. 2. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද තිබීම.	**<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>** **<u>NVQ මට්ටම් 6</u>** මරදාන

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
204.	D28T001P5.1	පෑස්සුම් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව National Diploma in Welding Technology අර්ධ කාලීන, අවුරුදු 01 ½	1. අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 3 හෝ 4 සහතික ලබා තිබීම; *හෝ* අ.පො.ස.(උ.පෙළ) විභාගයේ ඕනෑම විෂය ධාරාවකින් විෂයයන් 3 ක් සමත් වී තිබීම (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර). 2. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද තිබීම.	**ඉංග්‍රීසි මාධ්‍යය** NVQ මට්ටම් 5 මරදාන ඇඹිලිපිටිය
205.	D29T001P5.0	නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව National Diploma in Production Technology අර්ධ කාලීන, අවුරුදු 01 ½	1.අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 4 සහතික ලබා තිබීම; *හෝ* අ.පො.ස.(උ.පෙළ) විභාගයේ ඕනෑම විෂය ධාරාවකින් විෂයයන් 3 ක් සමත් වී තිබීම (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර). 2. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද තිබීම.	**ඉංග්‍රීසි මාධ්‍යය** NVQ මට්ටම් 5 මහනුවර
206.	ETC 18.1	ජාතික තාක්ෂණ සහතිකය - යාන්ත්‍රික ඉංජිනේරු - නිෂ්පාදන තාක්ෂණය NCT (Mechanical Engineering - Production Technology) නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව අර්ධ කාලීන, අවුරුදු 03 I හා II වසර නිෂ්පාදන තාක්ෂණය ඩිප්ලෝමාවේ විෂයමාලාව ආවරණ කෙරෙන අතර, III වසර පෙර පරිදිම NCT (යාන්ත්‍රික ඉංජිනේරු) විෂයමාලාවේ අවසන් වසර සම්පූර්ණ කර, සිසුන්ගේ විභාග ප්‍රතිඵල මත NCT සහතිකය මෙම දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලැබේ.	1. දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් භාෂා මාධ්‍යය (සිංහල / දෙමළ / ඉංග්‍රීසි), ගණිතය, විද්‍යාව සහ වෙනත් විෂයයන් තුනක් ඇතුලුව විෂයයන් හයකින් (06) සමත් වී තිබීම, සහ මෙම සුදුසුකම් මත බඳවාගනු ලබන සිසුන් පාඨමාලාවේ දෙවන වසර අවසන් වීමට පෙර අදාළ විෂයය ක්ෂේත්‍රයෙන් NVQ 4 සුදුසුකම් ලබාගැනීම අනිවාර්යය වේ. *හෝ* අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් විෂයයන් තුනකින් (03) එකවර සමත්වීම (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර); *හෝ* අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 4 සහතිකය ලබා තිබීම- 2. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද තිබීම.	**ඉංග්‍රීසි මාධ්‍යය** **NVQ මට්ටම් 5** මරදාන කෑගල්ල රත්මලාන

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
207.	D33T002P5.0	CNC තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව National Diploma in CNC Production Technology (Computer Numerical Control) අර්ධ කාලීන, අවුරුදු 01 ½	1. අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 4 සහතික ලබා තිබීම; *හෝ* අ.පො.ස. (උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය / ගණිතය / විද්‍යාව යන විෂය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් එකවර සමත් වී තිබීම(GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර); *හෝ* අ.පො.ස.(උ.පෙළ) කලා විෂය ධාරාවේ දෘඩ තාක්ෂණය (Hard Technology) යටතේ වූ යාන්ත්‍රික තාක්ෂණය (Mechanical Technology) / තොරතුරු තාක්ෂණය (ICT) විෂය සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් තුනක් සමත් වී තිබීම. (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර)	**<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>** **<u>NVQ මට්ටම් 5</u>** ගම්පහ

ආහාර තාක්ෂණ පාඨමාලා
පූර්ණ කාලීන පාඨමාලා

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය/ NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
208.	D15T001F7.1	ආහාර තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව Higher National Diploma in Food Technology (NVQ 5 හා 6 ඒකාබද්ධ පාඨමාලාවකි) පූර්ණ කාලීන, අවුරුදු 02 ½ (පදනම් පාඨමාලාවක් ඇතුළත්ය) රැකියාගත පුහුණුව මාස 06 කි.	1. අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 4 සහතික ලබා තිබීම; *හෝ* අ.පො.ස. (උ.පෙළ) ජෛව තාක්ෂණවේදය / විද්‍යාව යන විෂය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් එකවර සමත් වී තිබීම(GIT,සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර); *හෝ*	**<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>** **<u>NVQ මට්ටම් 6</u>** මහනුවර

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය/ NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
208.	D15T001F7.1		අ.පො.ස. (උ.පෙළ) කලා විෂය ධාරාවේ මෘදු තාක්ෂණය (Soft Technology) යටතේවූ ආහාර තාක්ෂණය (Food Technology) කෘෂි තාක්ෂණය - (Agro Technology) යන විෂයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සමාර්ථයක් සහිතව විෂයයන් තුනක් (03) එකවර සමත් වී තිබීම(GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර)	
209.	D15T001F5.1	ආහාර තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව National Diploma in Food Technology පූර්ණ කාලීන, අවුරුදු 01 ½ (පදනම් පාඨමාලාවක් ඇතුළත්ය) රැකියාගත පුහුණුව මාස 06 කි.	1. අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 4 සහතික ලබා තිබීම; *හෝ* අ.පො.ස. (උ.පෙළ) ජෛව තාක්ෂණවේදය / විද්‍යාව යන විෂය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් එකවර සමත් වී තිබීම (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර); *හෝ* අ.පො.ස. (උ.පෙළ) කලා විෂය ධාරාවේ මෘදු තාක්ෂණය (Soft Technology) යටතේවූ ආහාර තාක්ෂණය(Food Technology) කෘෂි තාක්ෂණය - (Agro Technology) යන විෂයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සමාර්ථයක් සහිතව විෂයයන් තුනක් (03) එකවර සමත් වී තිබීම(GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර)	**ඉංග්‍රීසි මාධ්‍යය** NVQ මට්ටම් 5 කුලියාපිටිය මහනුවර

මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රය
පූර්ණ කාලීන පාඨමාලා

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
210.	D36T001F5.1	ස්වර්ණාභරණ නිර්මාණය හා නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව	1. අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 4 සහතික ලබා තිබීම; *හෝ*	**ඉංග්‍රීසි මාධ්‍යය** NVQ මට්ටම් 5 මරදාන

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
		National Diploma in Jewellary Design & Manufacturing Technology පූර්ණ කාලීන, අවුරුදු 01 ½ රැකියාගත පුහුණුව මාස 06 කි.	අ.පො.ස.(උ.පෙළ) විෂය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් එකවර සමත් වී තිබීම (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර). 2. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද තිබීම.	

මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රය
අර්ධ කාලීන පාඨමාලා

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
211.	D36T001P5.1	ස්වර්ණාභරණ නිර්මාණය හා නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව National Diploma in Jewellary Design & Manufacturing Technology අර්ධ කාලීන, අවුරුදු 01 ½	1. අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 4 සහතික ලබා තිබීම; *හෝ* අ.පො.ස.(උ.පෙළ) විෂය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් එකවර සමත් වී තිබීම(GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර). 2. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද තිබීම.	<u>ඉංග්‍රීසි මාධ්‍යය</u> <u>NVQ මට්ටම් 5</u> මරදාන

අධ්‍යාපන ක්ෂේත්‍රය
පූර්ණ කාලීන පාඨමාලා

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
212.	M80T003F5.0	දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ජාතික ඩිප්ලෝමාව	කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ තාක්ෂණ /	<u>ඉංග්‍රීසි මාධ්‍යය</u> <u>NVQ මට්ටම 5</u> **යාපනය** **මහනුවර**

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
212.	M80T003F5.0	National Diploma in Teaching English as a Second Language පූර්ණ කාලීන අවුරුදු 01 රැකියාගත පුහුණුව මාස 06 කි.	කාර්මික විද්‍යාලයන්හි පැවැත්වෙන වෘත්තීය ඉංග්‍රීසි පිළිබඳ ජාතික සහතිකය (NCPE) ලබා තිබීම; *හෝ* වාණිජ කර්මාන්ගත හා වැඩිදුර අධ්‍යාපනය සඳහා ඉංග්‍රීසි පිළිබඳ ජාතික සහතිකය ලබා තිබීම (NCE); *හෝ* අ.පො.ස (උ.පෙළ) විභාගයෙන්, සාමාන්‍ය ඉංග්‍රීසි (General English) විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව, විෂයයන් තුනකින් (03) සමත් වී තිබීම.	කුරුණෑගල **මරදාන** කුලියාපිටිය කෑගල්ල **අක්කරේපත්තු** සම්මන්තුරේ වවුනියා මාතලේ

අධ්‍යාපන ක්ෂේත්‍රය
අර්ධ කාලීන පාඨමාලා

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
213.	M80T003P5.0	දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ජාතික ඩිප්ලෝමාව National Diploma in Teaching English as a Second Language අර්ධ කාලීන අවුරුදු 01 ½	කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ තාක්ෂණ / කාර්මික විද්‍යාලයන්හි පැවැත්වෙන වෘත්තීය ඉංග්‍රීසි පිළිබඳ ජාතික සහතිකය (NCPE) ලබා තිබීම; *හෝ* වාණිජ කර්මාන්තගත හා වැඩිදුර අධ්‍යාපනය සඳහා ඉංග්‍රීසි පිළිබඳ ජාතික සහතිකය ලබා තිබීම (NCE); *හෝ* අ.පො.ස (උ.පෙළ) විභාගයෙන්, සාමාන්‍ය ඉංග්‍රීසි (General English) විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව, විෂයයන් තුනකින් (03) සමත් වී තිබීම. 2. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද තිබීම.	**<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>** <u>NVQ මට්ටම 5</u> යාපනය ඇඹිලිපිටිය සම්මන්තුරේ මාතර ගම්පහ

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
214.	M80T005P5.0	National Diploma in Early Childhood Development Education අර්ධ කාලීන අවුරුදු 01 ½	1. අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 4 සහතික ලබා තිබීම. *හෝ* අ.පො.ස.(උ.පෙළ) ඕනෑම විෂය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් එකවර සමත් වී තිබීම. (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර) 2. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද තිබීම.	**<u>ඉංග්‍රීසි මාධ්‍යය</u>** **<u>NVQ මට්ටම් 5</u>** යාපනය

රෙදිපිළි හා ඇඟළුම් ක්ෂේත්‍රය
අර්ධ කාලීන පාඨමාලා

අනු. අංකය	*පාඨමාලා කේතය*	*පාඨමාලාවේ නම හා ස්වභාවය*	*ඇතුළත්වීමේ සුදුසුකම්*	*පාඨමාලා මාධ්‍යය/ NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල*
215.	D18T007BP5.0	විද්‍යාණුකූල ඇඳුම් නිර්මාණකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව National Diploma in Bespoke Design Tailoring Technology අර්ධ කාලීන අවුරුදු 01 ½	1. අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 4 සහතික ලබා තිබීම. *හෝ* අ.පො.ස.(උ.පෙළ) ඕනෑම විෂය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් එකවර සමත් වී තිබීම. (GIT, සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව හැර) 2. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද තිබීම.	<u>ඉංග්‍රීසි මාධ්‍යය</u> <u>NVQ මට්ටම 5</u> යාපනය

සටහන : ඉහත සඳහන් පාඨමාලාවලට අමතරව එක් එක් විෂය ක්ෂේත්‍රයට අදාළ කෙටිකාලීන පාඨමාලා තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල මගින් ආරම්භ කිරීමට කටයුතු කරනු ඇත. එම පාඨමාලා පිළිබඳ වැඩිදුර තොරතුරු ඔබට ආසන්න තාක්ෂණ /කාර්මික විද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය වෙතින් ලබාගත හැකිය.

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය/ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන ආයතන සඳහා සෞඛ්‍ය රියදුරු තනතුරට බඳවා ගැනීම 2026 - විවෘත

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය/ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන ආයතනවල සෞඛ්‍ය රියදුරු තනතුරු සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. බඳවා ගැනීමේ ක්‍රමය :-

ලිඛිත පරීක්ෂණයක හා ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලබන අතර ලිඛිත පරීක්ෂණයෙන් සමත් වන මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් ඔවුන් ලබාගන්නා ලද කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් සම්මුඛ පරීක්ෂණය සහ ප්‍රායෝගික හා වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ප්‍රායෝගික හා වෘත්තීය පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේදී ලබාගත් ලකුණු සහ වෘත්තීය පරීක්ෂණයේදී ලබාගත් ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙලට බඳවා ගනු ලැබේ.

	විෂයයන්	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
ලිඛිත පරීක්ෂණය	මාර්ග නීති / මෝටර් කාර්මික දැනුම	100	40%
	ප්‍රථමාධාර/රෝගී සත්කාර හා ප්‍රවාහන සේවා	100	40%
වෘත්තීය පරීක්ෂණය	රිය පැදවීමේ නිපුණතා මැනීමේ පරීක්ෂණය	100	40%

2. අවශ්‍ය සුදුසුකම් :-

අධ්‍යාපන සුදුසුකම්	අ.පො.ස(සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම
වෘත්තීය සුදුසුකම්	A ශ්‍රේණියේ රියදුරු බලපත්‍රයක් තිබිය යුතු ය. (වත්මන් රියදුරු බලපත්‍රයේ C හා D කාණ්ඩ සහිත)
පළපුරුද්ද	A ශ්‍රේණියේ රියදුරු බලපත්‍රයක් ලබාගැනීමෙන් පසු (වත්මන් රියදුරු බලපත්‍රයේ C හා D කාණ්ඩ සහිත) අවම වශයෙන් වසර 05 ක රියදුරු තනතුරක සේවා පළපුරුද්දක් තිබිය යුතු ය (සහතික මගින් සනාථ කළ යුතු ය)
කායික සුදුසුකම්	I. සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් දිවා රාත්‍රී කාලයේ රාජකාරි සඳහා සුදුසු තත්වයක සිටිය යුතු අතර අවශ්‍යතාවය මත පැය 24 ම සේවා මුර වලට රාජකාරි සඳහා සුදුසු තත්වයක සිටිය යුතු අතර ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය. II. අවම උස අඩි 05 යි අඟල් $2^{1/2}$ ක් විය යුතුය. III. ඇස් පෙනීම සම්බන්ධයෙන් පහත සඳහන් උපමානවල දක්වා ඇති යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. (*අ*). බර වාහන රියදුරන් බඳවා ගැනීමේදී ඇස් පෙනීම සම්බන්ධයෙන් ලංකා අක්ෂි වෛද්‍ය සංගමය විසින් පිළිගත් නිර්ණායක වන වම් ඇස හා දකුණු ඇස 6/9 සීමාව තුළ පැවතිය යුතු ය. (*ආ*). වර්ණ අන්ධතාවය පරීක්ෂා කිරීමේ ලංකා අක්ෂි වෛද්‍ය සංගමයේ නිර්දේශිත නිර්ණායකයන් අනුව වර්ණ අන්ධතාවය නොතිබිය යුතු ය.

වෙනත්	I.	ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
	II.	අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය. තම පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිගෙන් ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන් සහිතව චරිත සහතිකයක් හා ප්‍රදේශයේ (පූජ්‍ය පක්ෂය ඇතුළුව) පිළිගත් ප්‍රභූවරයෙකු ඇතුළුව චරිත සහතික 02 ක්
	III.	තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.
	IV.	මෙම තනතුර සඳහා අයදුම් කළ හැක්කේ පිරිමි අයදුම්කරුවන්ට පමණි.

3. සේවයේ නියුක්ත කරවීමේ හා සේවා කොන්දේසි :-

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.
II. මෙම පත්වීම අවුරුදු 3ක පරිවාස කාලයකට අයත්ය.
III. මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහයේ විධිවිධානවලට යටත්වේ.
IV. බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම *ගැසට්* නිවේදනය මගින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් ගැටලු සහගත තත්ත්වයක් උදාවුවහොත් ඒ පිළිබඳව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

4. වයස් සීමාව :-

ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18 ට නොඅඩු වියයුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

5. වැටුප් පරිමාණය :-

මෙම තනතුරට රු. 42,780 – 10X490 – 10X540 – 10X590 – 12X630 – රු. 66,540/- මාසික වැටුප් පරිමාණයක් හිමිය. (PL – 03 2025)

2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.

6. අපේක්ෂකයින් තෝරාගැනීම හා අනන්‍යතාවය :-

ලිඛිත පරීක්ෂණයෙන් සමත් වන මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් ඔවුන් ලබාගන්නා ලද කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් සම්මුඛ පරීක්ෂණය සඳහ ප්‍රායෝගික හා වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී හා ප්‍රායෝගික හා වෘත්තීය පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත්‍රය.
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

7. අයදුම්පත් 2026.11.20 දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අධ්‍යක්ෂ (ප්‍රවාහන),
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
අංක 106, ඩඩ්ලි සේනානායක මාවත,
කොළඹ 08.

8. අයදුම් කළ යුතු ආකාරය :-

I. ඉදිරිපත් කළ යුතු අයදුම් පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනයේ අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිත කර සකස් කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්පත සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය මගින් ද බාගත කළ හැක.

II. අයදුම්පත් බහාලන කවරයේ වම්පස "සෞඛ්‍ය රියදුරු III වන ශ්‍රේණිය (විවෘත) බඳවාගැනීම - 2026" ලෙස සඳහන් කළ යුතු ය.

III. අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු / සමාදාන විනිශ්චයකාරවරයකු දිවුරුම් කොමසාරිස්වරයකු / නීතිඥවරයකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරී නිලධාරියකු/ පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු.854,880.00 කට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථීර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

IV. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

V. විවෘත අයදුම්කරුවන් සඳහා විභාග ගාස්තුව රු. 1,000.00 කි. ලංකා බැංකුව, තැප්‍රෝබේන් ශාඛාවේ අංක 7041318 දරන "සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ විභාග ගාස්තු රැස්කිරීම" යන ගිණුමට බැරවන පරිදි මෙම මුදල ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා ලබාගත් රිසිට්පත ආදර්ශ අයදුම්පතෙහි අංක 08 යටතේ ඇති කොටුව තුළ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. (ලදුපත ඇලවීමට පෙර එහි පිටපතක් තබාගන්න) මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

9. මේ සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම සම්බන්ධ කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

10. සාවද්‍ය තොරතුරු සැපයීම :-

ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන්කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවාගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවාගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගවලට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ,
ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ආදර්ශ අයදුම්පත්‍රය

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය / සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන ආයතන සඳහා සෞඛ්‍ය රියදුරු තනතුරට බඳවා ගැනීම 2026 - විවෘත

තනතුරට අයදුම් කරන මාධ්‍ය : සිංහල ☐ ඉංග්‍රීසි ☐ දෙමළ ☐

1. 1.1 අයදුම්කරුගේ මුලකුරු සමග නම : .....
.....

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

1.3 සම්පූර්ණ නම (සිංහල අකුරින්) : .....
.....

2. 2.1 පෞද්ගලික ලිපිනය (සිංහල අකුරින්) : .....
.....

2.2 පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

3. 3.1 උපන් දිනය : වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | |

3.2 අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු : | | මාස : | | දින : | |

4. ජාතික හැඳුනුම්පත් අංකය - | | | | | | | | | | | | |

5. දුරකථන අංකය : a. (ජංගම) - | | | | | | | | | | |
b. (නිවස) - | | | | | | | | | | |
c. (වට්ස්ඇප්) - | | | | | | | | | | |

6. විද්‍යුත් තැපැල් ලිපිනය : .....

7. සුදුසුකම් : (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)

7.1 අධ්‍යාපන සුදුසුකම් : අ.පොස. (සා/පෙළ)

පළමු වර

වර්ෂය : .....විභාග අංකය : .....

විෂයය	*සාමාර්ථය*

දෙවන වර

වර්ෂය : .....විභාග අංකය : .....

විෂයය	*සාමාර්ථය*

7.2 වෘත්තීය සුදුසුකම් : .....

.....

7.3 පළපුරුද්ද : .....

.....

8. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තරය :

8.1 විභාග ගාස්තු ගෙවූ කාර්යාලය : .....

8.2 ලදුපත් අංකය හා දිනය : .....

8.3 ගෙවූ මුදල : .....

ලංකා බැංකු ශාඛාවට මුදල් ගෙවූ රිසිට්පත නොගැලවෙන සේ මෙහි අලවන්න

9. අයදුම්කරුගේ සහතිකය :

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි ඇතුළත් යම්කිසි තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව සොයාගනු ලැබුවහොත් එසේ සොයාගන්නා ලද්දේ තෝරා ගැනීමට පෙරනම් එම අයදුම්පත අවලංගු වන බවද, තෝරා ගැනීමෙන් පසුව නම් යම්කිසි වන්දියක් නොමැතිව මම සේවයෙන් පහ කරනු ලබන බවද, තෝරා ගතහොත් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටද එකඟ වෙමි.

දිනය : ..... අත්සන : .....

10. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..... මයා මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු මා ඉදිරිපිටදී .....දින ඔහුගේ අත්සන තැබූ බවද සහතික කරමි.

....,
දිනය සහතික කරන නිලධාරියාගේ අත්සන.

සම්පූර්ණ නම : .....
තනතුර : .....
ලිපිනය : .....

10 - 818